ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

වාර්ෂික වාර්තාව

2018

අපගේ දැක්ම

- සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලු ම කර්මාන්ත සංවර්ධනය කිරීම

අපගේ මෙහෙවර

- සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලු ම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයා දීම

කෙටි යෙදුම් ලේඛනය

AAT	-	ගණකාධිකාරී ශිල්පීන්ගේ සංගමය
AD	-	පරිපාලන අංශය
ATRDC	-	යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
BHC	-	ව්‍යාපාර සෞඛ්‍ය සහතිකය
CDLPF	-	සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය
CEDACS	-	ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය
CP	-	පිවිතුරු නිෂ්පාදන
CSC	-	පොදු සේවා මධ්‍යස්ථානය
ED	-	ඉංජිනේරු අංශය
EMS	-	පරිසර කළමනාකරණ ක්‍රමවේද
EPC	-	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය
EPL	-	පරිසර ආරක්ෂණ බලපත්‍රය
EPM	-	ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු
GP	-	හරිත ඵලදායීතාව
HRD	-	මානව සම්පත් සංවර්ධනය
HRM	-	මානව සම්පත් කළමනාකරණය
ICT	-	තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය
IDB	-	කාර්මික සංවර්ධන මණ්ඩලය
IED	-	කාර්මින ජනපද අංශය
IEs	-	කාර්මික ජනපද
ISO	-	ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය
GMP	-	යහපත් නිෂ්පාදන පරිචය
HM	-	උසස් කළමනාකරණය
HMI	-	මානව යන්ත්‍ර අතුරු මුහුණත
MD	-	අලෙවි අංශය
MM	-	මධ්‍යම කළමනාකරණය
MOU	-	අවබෝධතා ගිවිසුම
MOIC	-	කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
MSMEs	-	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
MT	-	මෙට්‍රික් ටොන්
NCPC	-	ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය
NGRS	-	ජාතික හරිත වාර්තකරණ ක්‍රමවේදය
OHSAS	-	වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය
PD	-	සැලසුම් අංශය
PLC	-	සීමිත පොදු සමාගම්
PVC	-	පොලි වීනයිල් ක්ලෝරයිඩ්
RDD	-	ප්‍රාදේශීය සංවර්ධන අංශය
RM	-	අමුද්‍රව්‍ය
RPD & SC	-	රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය
SCP	-	තිරසර පරිභෝජන සහ නිෂ්පාදන
SCX	-	උප කොන්ත්‍රාත් හුවමාරු
SME	-	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
SMI	-	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන
SLIIT	-	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය
SLIM	-	ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය

SLSI	-	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
SOR	-	බඳවා ගැනීම් පටිපාටිය
TSD	-	තාක්ෂණ සේවා අංශය
TOT	-	පුහුණුකරුවන් පුහුණු කිරීම
UNOPS	-	ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය

පටුන

ආයතනයෙහි පැතිකඩ.. **1 - 4**

ආයතනික ව්‍යුහය **5**

කළමනාකරණ සමාලෝචනය .... **6 - 8**

01) වර්ෂය තුළ කැපී පෙනෙන ක්‍රියාකාරකම්.. **9 - 11**

02) කාර්ය සාධන සමාලෝචනය .... **12 - 14**

03) මෙහෙයුම් සමාලෝචනය. **15**

3.1) පරිපාලන අංශය .... 16 - 17

3.2) ප්‍රාදේශීය සංවර්ධන අංශය .... 18 - 23

3.3) සැලසුම් අංශය .... 24 - 25

3.4) අලෙවි අංශය .... 26 - 28

3.5) කාර්මික ජනපද අංශය .... 29 - 34

3.6) ඉංජිනේරු අංශය .... 35 - 37

3.7) ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය .... 38 - 39

3.8) තාක්ෂණ සේවා අංශය .... 40 - 46

3.9) සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය........................ 47 - 48

3.10) රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය .... 49 - 51

04) මූල්‍ය සමාලෝචනය **52**

- විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 53
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 54
- හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය 55
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 56
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු .... 57 - 81

05) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සමාලෝචනය .... **82 - 90**

1.0 ආයතනයෙහි පැතිකඩ

1.1 නෛතික ස්වරූපය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින් ම 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1966 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. මෙම පනත ප්‍රකාරව කාර්මික සංවර්ධන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ වගකීම පැවරී තිබේ.

1.2 මණ්ඩලයෙහි අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනතෙහි සඳහන් කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ:

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම;
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.

  ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම, සහ උත්පාදනය වන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රමවේද සකස් කිරීම යන අරමුණු ඇතිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳ පොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර් ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම සහ
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ,සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයකට හෝ කාර්මික ආයතනකට හෝ ඒවාට අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම සේවා සහ පහසුකම් සැපයීම.

1.3 මණ්ඩලයෙහි අංශ සහ මණ්ඩලය විසින් සපයනු ලබන සේවා

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සේවා පැකේජයක් සපයා දීම පිණිස මෙම මණ්ඩලය අංශ නවයකින් ද, සම්භාණ්ඩ සහ රබර් යන අංශ සඳහා ම කැපවූ සේවා මධ්‍යස්ථාන දෙකකින් ද සමන්විත වේ.

(අ) ප්‍රාදේශීය සංවර්ධන අංශය

(ආ) සැලසුම් අංශය

(ඇ) අලෙවි අංශය

(ඈ) කාර්මික ජනපද අංශය

(ඉ) ඉංජිනේරු අංශය

(ඊ) ව්‍යාවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය

(උ) තාක්ෂණ සේවා අංශය

(ඌ) මුදල් අංශය

(එ) පරිපාලන අංශය

(ඒ) සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

(ඔ) රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

කාර්යාල 25 ක් සහිත දිස්ත්‍රික් කාර්යාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්මික ජනපද 19 කාර්මික ජනපද අංශය යටතේ ක්‍රියාත්මක වේ. ඉංජිනේරු අංශය යටතේ ක්‍රියාත්මක වන සේවා මධ්‍යස්ථාන දෙකක් තිබේ. කම්හල් පහසුකම්, රසායනාගාර පහසුකම් සහ අනෙකුත් පුහුණු පහසුකම් වලින් සමන්විත ඉංජිනේරු අංශය සහ තාක්ෂණ සේවා අංශය මගින් නිෂ්පාදන සංවර්ධනය, ක්‍රියාවලි සංවර්ධනය සහ දැනුම ලබා දීම සම්බන්ධ සේවා සපයා දෙනු ලබයි. සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය සහ රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය විසින් දේශීය කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත ක්ෂේත්‍ර වලට අදාළව තාක්ෂණය සහ අනෙකුත් අදාළ සේවා සපයා දීම සහ පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අනුමත සමස්ත සේවක සංඛ්‍යාව 714 ක් වන අතර එම සේවකයින් කාර්ය මණ්ඩල මට්ටම් 11 ක් යටතේ වර්ග කර ඇත.

1.4 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර / කර්මාන්ත සඳහා සපයා දෙනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම්

- කර්මාන්ත සඳහා කළමනාකරණ පුහුණු සහ උපදේශක සේවා
- ව්‍යවසායකත්ව සංවර්ධනය
- කර්මාන්ත තොරතුරු සහ අන්තර්ජාල පහසුකම්
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය
- අලෙවිකරණ සහාය සඳහා පහසුකම් සැලසීම
- ඉංජිනේරු සේවා
- කර්මාන්ත අවස්ථා හඳුනා ගැනීම
- තාක්ෂණ සංවර්ධනය සහ තාක්ෂණය ලබා දීම
- ව්‍යාපාර සඳහා ශක්‍යතා අධ්‍යයන
- ඉංජිනේරු, කම්හල් සහ වාත්තු වැඩපොළ සේවා
- කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය
- නිෂ්පාදන සහ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම
- යන්ත්‍ර සූත්‍ර සඳහා තක්සේරු කිරීම්

කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය - 2018

සභාපති

මහින්ද ජිනසේන මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)

නිලබලයෙන් පත් වන

සන්ධ්‍යා විජයබණ්ඩාර මහත්මිය	-	(2018 ජනවාරි සිට පෙබරවාරි දක්වා)
එස්. බාලසුබ්‍රමනියම් මහතා	-	(**2018** මැයි සිට ඔක්තෝබර් දක්වා)
එම්.එන්.ඩී. ගුණරත්න මහතා	-	(2018 ජනවාරි සිට පෙබරවාරි දක්වා)
ටී.එන්. ඔසෙන් මහතා	-	(**2018** අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා)

මණ්ඩලයේ උපදේශක

රෝයි ජයසිංහ මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)

මණ්ඩලයෙහි සාමාජිකයින්

කලීල් රහුමතුල්ලා මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)
ෂමින් පෙරේරා මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)
නිෂාධ ගමගේ මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)
බී.එම්.පී. මෙන්ඩිස් මහතා	-	(2018 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා)
සංජීව දික්වැල්ල මහතා	-	(2018 ජනවාරි සිට මැයි දක්වා)
සඳුන් එස්.කේ. ගමගේ මහතා	-	(**2018** සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා)
එම්.එල්.ඒ. අමීර් මහතා	-	(**2018** සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා)

ආයතනික ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
අධ්‍යක්ෂ ජෙනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (සංවර්ධන)
අධ්‍යක්ෂ - පරිපාලන
අධ්‍යක්ෂ - මුදල්
අධ්‍යක්ෂ - සැලසුම්
අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන
අධ්‍යක්ෂ - කාර්මික ජනපද
අධ්‍යක්ෂ – ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය
අධ්‍යක්ෂ - ඉංජිනේරු
අධ්‍යක්ෂ - තාක්ෂණ සේවා
අධ්‍යක්ෂ - අලෙවිකරණ

කළමනාකරණ සමාලෝචනය

අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය ආර්ථිකය විසින් ඉල්ලා සිටින වඩා ඉහළ දායකත්වය, සුහුරු නිෂ්පාදනයේදී නවීන තාක්ෂණ ප්‍රවනතා අනුගත කර ගැනීම, සහ නිෂ්පාදන පිරිවැය, ගුණාත්ම භාවය සහ ප්‍රමාණාත්මක බව සම්බන්ධ පරාමිතීන්ට අදාළ දීර්ඝ කාලීන තිරසර භාවය වැනි සැලකිලිමත් වීම් සම්බන්ධ බොහෝ අභියෝගවලට මුහුණ දී සිටියි. එබැවින් ලොව පුරා තිබෙන කර්මාන්ත හතර වැනි කාර්මික විප්ලව යුගයට තල්ලු කරමින් ගෝලීය කර්මාන්ත පරිසරය තුළ සුවිශේෂී තාක්ෂණික පරිවර්තනයන් සිදු වෙමින් පවතින නිසා වහාම ප්‍රගාමී ප්‍රවේශයන් ක්‍රියාවෙහි යෙදවිය යුතුව තිබේ.

මෙම සංදර්භය තුළ නිෂ්පාදන සහ ක්‍රියාවලිවල ගුණාත්මක භාවය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ව්‍යාපාරයෙහි ව්‍යාප්තිය ප්‍රචලිත කිරීම, තාක්ෂණ යෙදවුම්, සැපයුම් දාම කළමනාකරණය සහ එහි සහාය සේවා ආදියට අදාළව තිරසර භාවය සහ වෙළඳ පොළ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම පිණිස දේශීය කර්මාන්ත සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික ප්‍රවේශයන් ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. එබැවින් අවශ්‍ය කරන පරිවර්තන සිදු කිරීම සඳහා මෙම ක්‍රියාවලියට පහසුකම් සැලසීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලයට විශාල වගකීමක් පැවරී තිබෙන නිසා දේශීය කර්මාන්තවලට, විශේෂයෙන් ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට සේවා සැපයීමේදී මණ්ඩලයෙහි ක්‍රමෝපායයන් යළි නිර්වචනය කළ යුතුව තිබේ.

මෙම අභිප්‍රායට සමගාමීව, තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයෙහි නූතන තාක්ෂණ යෙදවුම් සහිතව ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවමින්, හරිත ව්‍යාපාර සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වලට පහසුකම් සලසමින් සහ ඒවා දිරිමත් කරමින් සහ රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් වලට සහාය වීම පිණිස සක්‍රීය කාර්ය භාරයක් ඉටු කරමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙනු ලබන සේවාවල බලපෑම ඒකාබද්ධ කිරීම පිණිස 2018 වර්ෂයේදී මණ්ඩලය අදාළ ආයතන සමග සබඳතා ගොඩනගා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම ඇඩි කළේය. එමෙන්ම, නවීන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් කර්මාන්තයෙහි මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොමැති අවස්ථා හඳුන්වා දීම සඳහාත්, අලෙවිකරණය සහ දැනුම ලබා දීමට අදාළව දේශීය සහ විදේශීය ආයතනික සබඳතා ගොඩනගා ගැනීමට සහාය දීම සඳහාත් නවීනතම උපකරණ සමගින් නවතම දැනුම සහ පුහුණුව ලබාදීම තුළින් කාර්ය මණ්ඩලය සවිබල ගන්වමින් ආයතනික පහසුකම වැඩි දියුණු කර ශක්තිමත් කිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට හැකි විය.

තවද, ඩිජිටල් ආර්ථිකය තුළ දේශීය කර්මාන්ත නූතන සංවර්ධනයන් සමග සම්බන්ධ කිරීමේ ක්‍රියාවලියට සහාය සපයා දීම කෙරෙහි මෙම වර්ෂයේදී වැඩි අවධානයක් යොමු කරන ලද අතර ඒ අනුව කර්මාන්තකරුවන්ගේ අලෙවිකරණ ප්‍රවේශයන්හි සීමා මායිම් පුළුල් කිරීම පිණිස කර්මාන්තකරුවන්ට ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ලබාදීම සිදු කරන ලදී. මෙය කර්මාන්තකරුවන්ට භූගෝලීය සීමාවන් හේතුවෙන් ඇති වන සීමා කිරීම් අවම කර ගනිමින් තම වෙළඳ පොළ ව්‍යාප්තිය වැඩි දියුණු කර ගැනීමට උපකාරී වෙයි. මෙම අලෙවිකරණ අවස්ථා මගින් කර්මාන්තකරුවන්ට තම ව්‍යාපාර කටයුතුවල වඩා ඉහළ කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකි වන පරිදි නව සහ විවිධත්වයෙන් යුත් පාරිභෝගික පදනමක් විවර කර දෙයි.

එපමණක් නොව, පුහුණුව සපයා දීමේදී සහ නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය කිරීමේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් රබර් අංශයේ දේශීය කර්මාන්තකරුවන්ට සපයා දෙනු ලබන සේවා ඒකාබද්ධ කිරීමේ අරමුණ ඇතිව කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ද පියවර ගත්තේය. එයට අමතරව, හරිත වැඩසටහන්වලට සමගාමීව, තෝරාගත් කර්මාන්තකරුවන් කිහිප දෙනෙකුට ISO 14000 සහතිකය ලබා ගනිමින් ඔවුන්ගේ කර්මාන්ත නගා සිටුවීම සඳහා සහාය සපයා දීමේ නියමු වැඩසටහනක් ද ක්‍රියාත්මක කර නිම කරන ලදී.

දේශීය කර්මාන්තවලදී යොදා ගනු ලබන තාක්ෂණය නවීන තාක්ෂණය අනුගත කර ගනිමින් වැඩි දියුණු කිරීමේ වැඩසටහන් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ අනුව CERA ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා අවශ්‍ය කරන යටිතල ව්‍යූහය බොහෝ දුරට නිම කර තිබේ. මෙය දේශීය කර්මාන්තකරුවන්ගේ

නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහ පිරිවැය සම්බන්ධ පරාමිතීන් වැඩිදියුණු කරමින් දේශීය කර්මාන්තවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා එම කර්මාන්තවලට රොබෝ තාක්ෂණය හඳුන්වාදීමේ වේදිකාව බවට පත් වනු ඇත. එයට අමතරව, මෙම මධ්‍යස්ථානය බොහෝ ජාතික ගැටළු සඳහා රෝබෝ තාක්ෂණය පදනම් කර ගත් විසඳුම් සෙවීමේ දී ක්‍රියාකාරී මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරනු ඇති අතර, හතර වැනි කාර්මික විප්ලවය තුළ ඉදිරියේ සිදුවන ගෝලීය පරිවර්තනයන්ට සූදානම් වීම සඳහා දේශීය කර්මාන්තවලට දොරටු විවර කර දෙනු ඇත.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා මෙම මණ්ඩලයට සහ එහි කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් මග පෙන්වීම, සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම සහ සහයෝගය වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වශයෙන් මම මාගේ අවංක කෘතඥතාවය පළකර සිටිමි. කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් දේශීය කර්මාන්තකරුවන් වෙත සපයා දෙනු ලබන සේවාවන්හි මට්ටම වැඩි දියුණු කිරීම සඳහාත්, මණ්ඩලයෙහි අරමුණු සාර්ථක ලෙස මුදුන්පත් කර ගැනීම සඳහාත් කැපවී කටයුතු කරමින් අඛණ්ඩ සහයෝගය ලබා දුන් මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සියලු දෙනාටත්, විශේෂයෙන්ම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සහ සේවක සේවිකාවන් සියලුම දෙනාටත් මාගේ කෘතඥතාවය පුද කර සිටිමි. අවසන් වශයෙන්, මෙම වර්ෂය තුළදී මනා මූල්‍ය විනයක්, මනා කාර්ය කළමනාකරණයක් සහ මනා සංවිධාන පාලනයක් පවත්වා ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට අවශ්‍ය මග පෙන්වීම ලබා දුන් විගණන සහ කළමනාකරණ කමිටුවටත්, අභ්‍යන්තර විගණන අංශයටත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ අවංක ස්තුතිය පුද කිරීම සඳහා මෙය අවස්ථාව කර ගනිමි.

පී.එල්.යූ. රත්නමලල

අධ්‍යක්ෂ ජෙනරාල්

01) වර්ෂය තුළ කැපී පෙනෙන ක්‍රියාකාරකම්

1.1 ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය 2018

ශ්‍රී ලංකා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය විසින් අඛණ්ඩව 10 වැනි වරටත් සංවිධානය කරන ලද පාවහන් සහ සම්භාණ්ඩ වෙළඳ ප්‍රදර්ශනය - 2018 සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේදී 2018 පෙබරවාරි 02 වැනි දින විවෘත කරන ලදී. මෙහිදී ප්‍රධාන වශයෙන් ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ඔවුන්ගේ නිෂ්පාදන වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය අත්දැකීම් සහ දැනුම සපයා දීම සහ අන්තර් ජාතික වෙළඳ පොළ වෙත ප්‍රවේශ වීමට ඔවුන් දිරිගැන්වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරන ලදී.

එමෙන්ම, මෙම අංශයෙහි කර්මාන්තකරුවන්ගේ හැකියාවන් විදේශීය ගැනුම්කරුවන් වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස සහ පාවහන් උපාංග නිෂ්පාදනය කරන විදේශීය නිෂ්පාදකයින්, අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් සහ යන්ත්‍ර සූත්‍ර ආනයනකරුවන් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට දේශීය කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම පිණිස මෙම වෙළඳ ප්‍රදර්ශනයෙහි කොටසක් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහකාර අධ්‍යක්ෂ අමරනාත් විමලසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය විසින් මෝස්තර නිර්මාණ තරගයක් ද සංවිධානය කරන ලදී.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජනවාරි - මාර්තු)

1.2 සාමාජිකත්වය පිරිනැමීමේ උත්සවය - කාර්මික සංවර්ධන මණ්ඩලය සමග දෙරණ ව්‍යාපාරික සමාජය

මෙරට අනාගත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ලෙස, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මෙරට ජාතික ආර්ථික සංවර්ධනයෙහි සක්‍රීය සහ සවිමත් බලවේගයක් බවට පත් කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම පිණිස දිවයිනෙහි සෑම ප්‍රදේශයක ම සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙත ළඟා වීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිවර්තනයට සමගාමීව “දෙරණ - කා.සං.ම. සන්නාම විශිෂ්ටතා වැඩසටහන” දියත් කර තිබේ. මෙම ව්‍යාපෘතිය මගින් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දේශීය හා අන්තර් ජාතික වශයෙන් පුළුල් වූ විශාල පාරිභෝගික පදනමක් වෙත නිරාවරණය කරමින් එම කර්මාන්ත දියුණු කිරීම සඳහා එම කර්මාන්තවලට ශක්තිය ලබාදීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්ව දෙරණ ව්‍යාපාරික සමාජය විසින් නිර්මාණය කරන ලද එම සමාජයේ නිල වෙබ් අඩවිය කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් දියත් කරන ලද අතර, පැමිණ සිටි විශේෂ අමුත්තන් විසින් ලියාපදිංචි කර්මාන්තකරුවන් වෙත සාමාජිකත්වය ප්‍රදානය කිරීම මෙම සුවිශේෂී අවස්ථාව තවත් වර්ණවත් කළ අංගයක් විය.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජූලි - සැප්තැම්බර්)

1.3 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ඩිජිටල් අලෙවිකරණ දැනුම

ඩිජිටල් යුගයට පෙර කාලයේදී ව්‍යාපාරයක් පිළිබඳ දැනුවත් කිරීම ප්‍රධාන වශයෙන් ම මුද්‍රිත මාධ්‍යවලට සීමාවූ අතර ඒ සඳහා බොහෝ විට පුවත්පත් දැන්වීම් සහ අත් පත්‍රිකා යොදා ගනු ලැබීය. කෙසේ වෙතත්, වර්තමානයේ ඩිජිටල් මාධ්‍ය යොදා ගනිමින් තත්පර කිහිපයක් ඇතුළත ඕනෑම මූලික ව්‍යාපාරයක්, නැතහොත් ව්‍යාපාරයක් පිළිබඳ අදහසක් වුවද මුළු ලෝකය පුරා ප්‍රචාරය කළ හැක. ඩිජිටල් අලෙවිකරණය සඳහා වන මෙම ඉතා වැදගත් වේදිකාව ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් අතර වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ඒකකය ඒ සම්බන්ධයෙන් සම්මන්ත්‍රණයක් පැවැත්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් අතර තිබෙන බිය සහ අකමැත්ත තුරන් කිරීමේ පුළුල් සහ විස්තීර්ණ අරමුණ ඇතිව එම තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධ වැඩමුළුවක් ද පවත්වනු ලැබීය.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ගෝලීය වෙළඳ පොළ වෙත ප්‍රවේශවීම සඳහා තමන් සතු නිපුණතාවය ශක්තිමත් කර ගැනීමට සහ පාරිභෝගික අවශ්‍යතාවයට ගැළපෙන පරිදි තම නිෂ්පාදන සහ සේවා නිර්මාණය කිරීම පිණිස විශේෂිත පාරිභෝගිකයින් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට මෙම වැඩමුළුව උපකාරී විය. සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින තාක්ෂණ ප්‍රවීණතා පරිසරය සහ ඉතා සුළු කාලයක් ඇතුළත වෙළඳ පොළට නිරාවරණය කිරීමේ හැකියාව නිසා නිර්මාණය වී තිබෙන දැඩි තරගකාරීත්වය විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මුහුණ දී තිබෙන විශාලතම බාධකය වේ. මේ ආකාරයෙන් තාක්ෂණය යොදා ගැනීමට අකමැත්තක් දක්වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මෙම බාධක ජය ගැනීම සඳහා ඇති එකම ක්‍රමය වන්නේ නිසි පුහුණුව සහ උපදෙස් ලබා ගැනීමයි.

මූලාශ්‍රය: ව්‍යාපාරික පුවත් පිටුව, ඩේලි නිව්ස් පුවත් පත (2018 ඔක්තෝබර් 31)

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩලයේ මාධ්‍ය ඒකකය (2018 ඔක්තෝබර් 06)

1.4 කාර්මික සංවර්ධන මණ්ඩලය ජාත්‍යන්තර නිෂ්පාදන ප්‍රදර්ශනයට සහභාගීවීම

මෑතකදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී පවත්වන ලද ජාත්‍යන්තර නිෂ්පාදන ප්‍රදර්ශනයට කාර්මික සංවර්ධන මණ්ඩලය සහභාගී විය. මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ප්‍රථම වතාවට ස්මාර්ට් එක්ස්පො සහ ෆෙයා ඉන්දියා සමග ඒකාබද්ධව සංවිධානය කරන ලද COMEXPO නාමය යටතේ ඔවුන්ගේ නිෂ්පාදන වල වෙළඳ නාමය ප්‍රදර්ශනය කළහ. එමෙන්ම ඔවුන් දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළඳ පොළෙහි ද B2B වැඩසටහන සංවිධානය කරමින් ලොව පුරා සිටින දහස් සංඛ්‍යාත සේවාදායකයින් සහ පාරිභෝගිකයින් වෙත සේවා සපයා දෙති.

.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව(2018 ජූලි - සැප්තැම්බර්)

1.5 ඩිජිටල් සැපයුම් දාම විසඳුම්

ඩිජිටල් සප්ලයි චේන්ස් සොලියුෂන්ස් හි එස්.ජී.එස්. ගෝලීය ප්‍රධානී, උප සභාපති විසින් 2018 ජූනි 28 වැනි දින කටුබැද්ද කාර්මික සංවර්ධන මණ්ඩලයෙහිදී ඩිජිටල් සප්ලයි චේන්ස් පිළිබඳ හැඳින්වීමේ සැසියක් පවත්වන ලදී. ඩිජිටල් සැපයුම් දාම විසඳුමක් පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමටත්, පාරිභෝගිකයින් සමග සැපයුම් දාම සම්බන්ධ කිරීමටත් ව්‍යාපාරවලට උපකාරී වේ. මෙමගින් සමාගම්වලට ඔවුන්ගේ සමස්ත සැපයුම් දාමය තුළ ඇති සියලුම සැපයුම්කරුවන්ට සංරචක සහ පහසුකම් සොයා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ අධීක්ෂණය කිරීමට හැකියාව ලබා දෙයි. ඩිජිටල්කරණය කිරීම නිසා සැපයුම් දාමය අමුද්‍රව්‍ය, උපාංග සහ කොටස් සැපයුම්කරුවන්ගේ සිට එම ද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ ප්‍රවාහනකරුවන් දක්වා සහ අවසානයේ එම සේවා ඉල්ලුම් කරන පාරිභෝගිකයින් දක්වා වන සියලුම දෙනා ඇතුළත් සියලු පාර්ශව වලට පූර්ණ ලෙස විනිවිද වූ, සම්පූර්ණයෙන් ම ඒකාබද්ධ වූ අන්තර් සබැඳි පද්ධතියක් බවට පත් වේ.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 අප්‍රේල් - ජූනි)

02. කාර්ය සාධන සමාලෝචනය

<u>මණ්ඩලයේ භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශය</u>

2018 වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය මෙරට ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ආකාරවලින් සහාය සහ උපකාරක සේවා සපයා දී ඇත. එමෙන්ම, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම සම්බන්ධ ක්‍රමෝපාය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ද මණ්ඩලය බැඳී සිටියි. මෙම අරමුණු මුදුන්පත් කර ගැනීම පිණිස සහ කර්මාන්ත සඳහා දේශීය මෙන් ම විදේශීය වෙළඳ පොළ ද පුළුල් කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය රේඛීය අමාත්‍යාංශය සමග ඒකාබද්ධ වී විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති හඳුන්වා දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නිරත වී සිටියි.

- **පුහුණු වැඩසටහන්**

කර්මාන්තවල ඵලදායීත්වය නගා සිටුවීම පිණිස කර්මාන්තකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එම පුහුණු වැඩසටහන් ව්‍යවසායකත්වය, කළමනාකරණය, තාක්ෂණය සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම ආදී ක්ෂේත්‍රවල ඔවුන් සතු කුසලතාවය ශක්තිමත් කිරීමට උපකාරී වී ඇත. 2018 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වන කාල පරිච්ඡේදය තුළ මණ්ඩලය අත්කර ගෙන ඇති භෞතික ප්‍රගතිය සලකා බැලීමේදී, එම කාලය තුළ දී මණ්ඩලය කළමනාකරණ සහ තාක්ෂණය ලබා දීමේ පුහුණු වැඩසටහන් 300 ක් පවත්වා ඇති අතර එම වැඩසටහන් වලින් කර්මාන්තකරුවන් 5,518 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.

2.1 වගුව: කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2018

අංකය	විස්තරය	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන්
(1)	කළමනාකරණ පුහුණු වැඩසටහන්	180	2,155
(2)	තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්	120	3,363
එකතුව		**300**	**5,518**

➢ **වාර්තා සකස් කිරීම:**

මෙම කාල පරිච්ඡේදය තුළදී බැංකු ණය පහසුකම් ලබා ගැනීම සඳහා සහ අනෙකුත් කාර්යයන් සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පිළිබඳ තක්සේරු වාර්තා, තාක්ෂණික වාර්තා සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තා සකස් කරන ලදී. ඒ අනුව යන්ත්‍ර සූත්‍ර තක්සේරු කිරීම්, ව්‍යාපෘති ශක්‍යතා සහ තාක්ෂණික වාර්තා යන කාණ්ඩ යටතේ සකස් කරන ලද මුළු වාර්තා ගණන 502 ක් විය.

2.2 වගුව: වාර්තා සකස් කිරීම - 2018

අංකය	විස්තරය	වාර්තා ගණන
(1)	යන්ත්‍රසූත්‍ර තක්සේරු වාර්තා	89
(2)	ව්‍යාපෘති ශක්‍යතා වාර්තා	92
(3)	තාක්ෂණික වාර්තා	321
එකතුව		**502**

➢ **පවතින කාර්මික ජනපද නවීකරණය කිරීම සහ වැඩි දියුණු කිරීම**

(1) කර්මාන්තශාලා සඳහා ඉඩම් කට්ටි 22 ක් ලබා දෙන ලද අතර, කර්මාන්ත ශාලා 16 ක් අලුතින් ආරම්භ කර එමගින් රැකියා අවස්ථා 376 ක් උත්පාදනය කරන ලදී.

(2) කාර්මික ඉඩම් කට්ටි 29 ක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී.

➢ **සේවා**

කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය කර්මාන්තවලට ඒවායෙහි නිෂ්පාදන ගුණාත්මක භාවය සහ වෙළඳ පොළ ප්‍රවේශය වැඩි දියුණු කර ගැනීම සඳහා සහ නිෂ්පාදන ක්‍රියාවලි සංවර්ධනය කිරීම සඳහා සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කරන නවීන තාක්ෂණය සහ මනා කළමනාකරණ පරිචයන් සම්බන්ධ සේවා සහ මග පෙන්වීම සපයා දීමෙහි නිරත වී සිටියි. 2018 ජනවාරි 01 වැනි දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වන කාලය තුළදී මණ්ඩලය අත්කර ගෙන ඇති ප්‍රගතිය සලකා බැලීමේදී මණ්ඩලය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවය අනුව ඉංජිනේරු සේවා සපයා දීම, වාත්තු වැඩපොළ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා දීම, ලෝහ සහ රබර් කර්මාන්ත සඳහා අවශ්‍ය කරන සේවා සපයා දීම, යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කිරීම සහ කර්මාන්ත තොරතුරු සපයා දීම සිදු කරන ලදී. මෙම සේවා ලබා ගත් මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3,317 ක් වේ. ඉංජිනේරු සේවා කාණ්ඩය යටතේ, කර්මාන්තකරුවන් 198 දෙනෙකු සඳහා අවශ්‍ය සහාය සපයා දෙන ලද අතර, කර්මාන්තකරුවන් 65 දෙනෙකු සඳහා වාත්තු සේවා ද, කර්මාන්තකරුවන් 252 දෙනෙකු සඳහා විද්‍යුත් ලෝහාලේපන සේවා ද සපයා දී ඇත. එමෙන්ම මණ්ඩලය කර්මාන්තකරුවන් 374 දෙනෙකු සඳහා අබලි ලෝහ මෙ.ටො. 1,500 ක් ද, කර්මාන්තකරුවන් 588 දෙනෙකු සඳහා රබර් සංයෝග කි.ග්‍රෑ. 28,000 ක් ද සපයා දී ඇත. එයට අමතරව, මණ්ඩලය කේන්ද්‍රාපසාරී රබර් කිරි ලීටර් 2,500 ක් සහ ඇඹරුම් රබර් සංයෝග කි.ග්‍රෑ. 28,000 ක් ද සපයා දී ඇත.

වගුව 2.3: කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙන ලද සේවා පිළිබඳ විස්තර - 2018

අංකය	විස්තරය	සු.ම.ක. සංඛ්‍යාව
(1)	ඉංජිනේරු සේවා	515
(2)	වාත්තු වැඩපොළ, සහ ලෝහ සහ රබර් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයා දීම	1,092
(3)	යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය	09
(4)	කර්මාන්ත තොරතුරු සපයා දීම	1,701
එකතුව		**3,317**



03. මෙහෙයුම් සමාලෝචනය

3.1 පරිපාලන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම අංශවල කාර්ය සාධනය කාර්යක්ෂම අයුරින් පවත්වා ගැනීම තහවුරු කිරීම පිණිස මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, සහ ආරක්ෂක සහ ප්‍රවාහන ක්‍රියාකාරම් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයේ පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන අංශයට පැවරී තිබෙන වගකීම වේ. එමෙන්ම මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම පිණිස බඳවා ගැනීමේ පරිපාටිය සහ උසස් කිරීම් පරිපාටිය සකස් කිරීම, ක්‍රමානුකූලව බඳවා ගැනීම් සිදු කිරීම, කාර්ය සාධන ඇගයීම් සිදු කිරීම, උසස් කිරීම් සහ විශ්‍රාම ගැනීම් සම්බන්ධ කරුණු, විනය පරීක්ෂණ පැවැත්වීම, දේශීය පුහුණු සූදානම් කිරීම සහ සපයා දීම, සේවක සුභසාධන සහ සේවක වන්දි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම ආදිය මෙම අංශයට පැවරී ඇති තවත් කාර්යයන් කිහිපයක් වේ. ඒ අනුව සාර්ථක පරිපාලන අංශයක් නොමැතිව ආයතනයක් වෘත්තියවේදීමය ලෙස මනාව ක්‍රියාත්මක නොවේ.

කාර්යාල පරිපාලනය සේවා ස්ථානයක ඉහළ ඵලදායීත්වය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපාන ප්‍රධානතම අංග වලින් එකක් වේ. ඒවා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සේවකයින් අතර සම්බන්ධතාවය පවත්වා ගෙන යන සම්බන්ධකයක් ලෙස ක්‍රියා කරයි. ඒවා කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කරමින් ඔවුන්ට ආයතනයේ අභිමතාර්ථ අවබෝධ කරවයි. එමෙන්ම, පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන අංශයට මණ්ඩලයේ සේවකයින්ගේ හැකියා වැඩිදියුණු කිරීමේ සහ අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීමේ වගකීම ද පැවරී තිබේ. මණ්ඩලයේ සේවකයින්ගේ පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කර ගැනීම සඳහා ඔවුන් දිරිමත් කරමින්, පොළඹවමින් සහ ඒ සඳහා ඔවුන්ට පහසුකම් සලසමින්, ළඟා විය යුතු ඉලක්ක වෙත ළඟා වීම සඳහා ඔවුන් අභිප්‍රේරණය කරමින්, කළමනාකරණ මට්ටමට අයත් කාණ්ඩවල සේවකයින්ගේ නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සහ අනෙකුත් කාණ්ඩවලට අයත් සේවකයින්ගේ නිපුණතා අපේක්ෂිත මට්ටමට වැඩි දියුණු කිරීම දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීමෙහි සහ විදේශීය පුහුණු අවස්ථා සලසා දීමෙහි ප්‍රධාන අරමුණ වේ. එමෙන්ම, මණ්ඩලය එහි සේවකයින්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව සේවකයින්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සහ හැකියා සංවර්ධනය කිරීම සඳහා තවත් වැඩසටහන් ගණනාවක් ද ක්‍රියාත්මක කර තිබේ.

මෙම කාල පරිච්ඡේදය තුළදී දේශීය පුහුණු කාණ්ඩය යටතේ පවත් වන ලද පුහුණු වැඩසටහන් 09 ට සේවකයින් 417 දෙනෙකු සහභාගී වූ අතර එම වැඩසටහන් සඳහා වැය කරන ලද මුළු මුදල රු. 1,003,700 ක් විය.

වගුව 3.1.1: සේවක පුහුණු වැඩසටහන් - දේශීය පුහුණු 2018

අංකය	වැඩසටහනෙහි නම
(01)	ව්‍යාපෘති යෝජනා වැඩසටහන සකස් කිරීම
(02)	MA කාණ්ඩයට අයත් සේවකයින් සඳහා පුහුණු වැඩසටහන
(03)	PL කාණ්ඩයට අයත් සේවකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන
(04)	අලුතින් බඳවා ගන්නා ලද ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් සඳහා හඳුන්වා දීමේ පුහුණු වැඩසටහන
(05)	PL කාණ්ඩයට අයත් සේවකයින් සඳහා ක්ෂේත්‍ර චාරිකා වැඩසටහන
(06)	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම
(07)	තනි පුද්ගල පුහුණු වැඩසටහන් සංඛ්‍යාව
(08)	උසස් අධ්‍යයන වැඩසටහන් සංඛ්‍යාව
(09)	මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවීම වැළැක්වීමේ වැඩසටහන

එමෙන් ම, සේවකයින්ගේ නිපුණතා සහ හැකියා සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව රු. 1,945,900 ක මුදලක් වැය කරමින් සේවකයින්ට ශිෂ්‍යත්ව සහ විදේශ සංචාර ද සපයා දෙන ලදී.

වගුව 3.1.2: ශිෂ්‍යත්ව සහ විදේශීය පුහුණු - 2018

අංකය	පුහුණු අංග
(01)	අත්දැකීම් ලබා ගැනීම සඳහා වියට්නාම සංචාරය 30.06.2018 සිට08.07.2018දක්වා
(02)	2018 - ශ්‍රී ලංකාව සඳහා කර්මාන්ත උද්‍යාන ඉදිකිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය 23.09.2018සිට 16.10.2018 දක්වා - චීනය
(03)	2018 – සංවර්ධනය වෙමින් පවතින රටවල පාවහන් කර්මාන්තයෙහි ඉහළ සංවර්ධනය සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය 03.10.2018 සිට 01.11.2018 දක්වා - චීනය
(04)	2018 – සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඇඳුම් සකස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව 12.10.2018 සිට 10.11.2018දක්වා - චීනය
(05)	සංවර්ධනය වෙමින් පවතින රටවල නිලධාරීන් සඳහා වෙළඳාම සඳහා ආධාර පිළිබඳ සම්මන්ත්‍රණය 16.10.2018 සිට 29.10.2018දක්වා- චීනය
(06)	සුගන්ධ තෙල් සහ සුගන්ධ ශාක සාර හා තෙල් යොදා කරනු ලබන ප්‍රතිකාර පිළිබඳ පුහුණු වැඩසටහන

වගුව 3.1.3: බඳවා ගැනීම් - 2018

අංකය	තනතුර	සේවකයින් සංඛ්‍යාව
(01)	අධ්‍යක්ෂ - ඉංජිනේරු	01
(02)	ඉංජිනේරු (සිවිල් / විදුලි)	02
(03)	ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී	27
(04)	ගබඩා භාරකරු	02
(05)	වැද්දුම් ශිල්පී	01
(06)	වෙල්ඩින්කරු	02
(07)	යාන්ත්‍රික ශිල්පී	04

3.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශය මණ්ඩලයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වය සපයා දීම පිණිස මූලික ක්‍රියාමාර්ග හතරක් ඔස්සේ ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 25 හි කර්මාන්ත ආර්ථික තත්ත්වය හඳුනා ගැනීම, නව කර්මාන්ත නිර්මාණය කිරීම, පවතින කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සහ ප්‍රාදේශීය සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලයෙහි සහ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයෙහි හැකියා සංවර්ධනය කිරීම එම ක්‍රියාමාර්ග හතර වේ. එයට අමතරව, ප්‍රාදේශීය කර්මාන්ත ආර්ථික වාර්තා සකස් කිරීම, අලුතින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථාපිත කිරීම, ක්ෂුද්‍ර කර්මාන්ත ස්ථාපිත කිරීම, පවතින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම, සහ අපනයනයට සූදානම් සමාගම් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් වේ.

<u>වර්ෂය තුළ විශේෂ අවස්ථා</u>

3.2.1. "පිවිතුරු නිෂ්පාදන පරිචයන් ප්‍රවර්ධනය කිරීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ISO 14001සහතිකකරණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම" ව්‍යාපෘතිය

ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය සමග එක්ව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම සහ අධීක්ෂණය මත **"පිවිතුරු නිෂ්පාදන පරිචයන් ප්‍රවර්ධනය කිරීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ISO 14001සහතිකකරණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම"** නැමති ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. තෝරාගත් කර්මාන්ත 14 ක කාර්මික ක්‍රියාකාරකම් සහ ඒ සඳහා යොදා ගනු ලබන තාක්ෂණය වෙනස් කිරීම මගින් එම කර්මාන්ත මගින් සිදු වන අහිතකර පාරිසරික බලපෑම අඩු කිරීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ විය. මෙම ව්‍යාපෘතියෙහි උපදේශක ආයතනය වන ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය පිවිතුරු නිෂ්පාදන ඇගයීම් සහ බලශක්ති විගණන හරහා සම්පත් කාර්යක්ෂමතාවය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය විසඳුම් සපයා දුන්නේය.

මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා සහ සහතිකකරණය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා මූල්‍ය ප්‍රදානයක් සපයා දීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණු වලින් එකක් වේ. ඒ අනුව එක් එක් කර්මාන්තය සඳහා උපරිමය රු. 300,000.00 ක මුදලක් සපයා දීමට නිර්දේශ කර ඇත.

ISO 14001 යනු ගෝලීය වශයෙන් පිළිගත් සහතික කිරීමක් වන අතර, මෙහෙයුම් ක්‍රියාවලි ක්‍රියාකාරකම් වලින් ඇතිවන පාරිසරික බලපෑම් කළමනාකරණය කරන සහ අවම කරන සමාගම් වලට එම සහතිකය පිරිනමනු ලැබේ. අහිතකර පාරිසරික බලපෑම් පාලනය කිරීමට සහ අඩු කිරීමට මෙන්ම ආයතනික පාරිසරික කාර්ය සාධනය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට ඉහත සඳහන් කරන ලද තෝරාගත් සමාගම් දිරිමත් කරන ලදී.

විදුලි බල සහ ජල පරිභෝජනය මෙන් ම ද්‍රව්‍ය නාස්තිය අඩු කිරීම, රසායනික ද්‍රව්‍ය සහ තෙල් වර්ග අපතේ යෑම මගින් සිදුවන පාරිසරික බලපෑම අවම කිරීම, අපජලය පිරියම් කිරීමේ පරිචයන් සහ විද්‍යුත් අපද්‍රව්‍ය ද ඇතුළු අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිසි ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම එම කර්මාන්ත විසින් අනුගමනය කරන ලද ක්‍රමෝපාය වලින් සමහරක් විය. නියාමන සහ පාරිසරික ප්‍රමිතීන් හරහා කර්මාන්ත අනුකූලතාවය සඳහා වන ඒකාබද්ධ පදනමක් සපයා දෙමින් තිරසර ව්‍යාපාර පරිචයන් දිරිමත් කිරීමට මෙය දායක වෙයි.

ව්‍යාපෘතිය මගින් ආවරණය කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්

- **කා.සං.ම. නිලධාරීන් සඳහා ISO 14001:2015 පරිසර කළමනාකරණ පද්ධති උපදේශක සංවර්ධන පුහුණු වැඩසටහන**

කර්මාන්තවලදී ISO 14001:2015 පරිසර කළමනාකරණ පද්ධති සංවර්ධනය පිළිබඳ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා මෙම පුහුණු වැඩසටහන සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය සමග එක්ව 2017 මැයි 17 වැනි දින සිට 19 වැනි දින දක්වා පවත්වන ලදී.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය

- **තෝරාගත් කර්මාන්තවල පිවිතුරු නිෂ්පාදන ඇගයීම්**
  - තෝරා ගන්නා ලද කර්මාන්ත 15 හි අපද්‍රව්‍ය උත්පාදනය සහ මෙහෙයවීම පිළිබඳ තත්ත්වය හඳුනා ගැනීම පිණිස එම කර්මාන්ත වෙත මූලික ඇගයීම් සිදු කිරීමේ සංචාර සිදු කරන ලදී.
  - ද්‍රව්‍ය සහ ජල පරිභෝජනය පිළිබඳ අදාළ මිනුම් යොදා ගනිමින් විස්තීර්ණ ඇගයීම් සිදුකිරීම මගින් තෝරාගත් කර්මාන්ත සඳහා සම්පත් කාර්යක්ෂමතාවය පිළිබඳ පාදක කාර්ය සාධන මට්ටම් ස්ථාපනය කරන ලදී. UNIDO ඇගයීම් ක්‍රමවේදයෙහි RECPදර්ශක සකස් කරන ලදී.
  - එක් එක් කර්මාන්ත ශාලාවෙහි අපද්‍රව්‍ය අඩු කිරීමේ අවස්ථා හඳුනා ගැනීම පිණිස බුද්ධි කලම්බන සැසි වැනි කණ්ඩායම් ශිල්පීය ක්‍රම හරහා විකල්ප උත්පාදනය කරන ලදී.
  - තාක්ෂණික මෙන්ම තාක්ෂණික නොවන, ස්ථාන විශේෂිත නිර්දේශ සපයා දෙන ලදී (ශක්‍යතා ඇගයීම් සහ පිරිවැයකරණය සමග).
  - ව්‍යාපාර සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් ස්ථාපිත කරන ලදී.

- **ISO 14001: 2015 අභ්‍යන්තර විගණක පුහුණුව**

ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය විසින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් 20 දෙනෙකු සහ තෝරාගත් කර්මාන්ත 14 ක නියෝජිතයින් 03 දෙනෙකු සඳහා ISO 14001: 2015 අභ්‍යන්තර විගණක පුහුණු වැඩසටහන 2018 සැප්තැම්බර් මස 03 වැනි දින කොළඹ 01 පිහිටි මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනයෙහි දී පවත්වන ලදී.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය

➢ **ISO 14001:2015 සහතික පත්‍ර සහ මූල්‍ය ප්‍රදාන ප්‍රදානය කිරීමේ උත්සවය**

මූල්‍ය ප්‍රදාන ප්‍රදානය කිරීමේ උත්සවය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරී, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ, ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානයේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2018 දෙසැම්බර් 28 වැනි දින කොළඹ පිහිටි මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනයේදී පවත්වන ලදී.

වගුව 3.2.1: ව්‍යාපෘතිය සඳහා තෝරාගත් කර්මාන්ත

අංකය	කර්මාන්තයේ නම	දිස්ත්‍රික්කය
01	ඇනා ඉන්ඩස්ට්‍රීස්	යාපනය
02	ඇනායි සී ෆුඩ්ස් පුද්ගලික සමාගම	යාපනය
03	සාරා ඉන්ඩස්ට්‍රීස්	යාපනය
04	ඊස්ට් ලංකා පොලිසැක්	මඩකලපුව
05	නිවල ටී ෆැක්ටරි	මාතර
06	මොරවක්කෝරලේ තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය	මාතර
07	ෆ්‍රීලැන්	මාතර
08	සෙසිලියන් ඇසෝසියේට්ස් පුද්ගලික සමාගම	රත්නපුර
09	ටල්පඩිතැන්න ටී ෆැක්ටරි	රත්නපුර
10	මිකෝ සිලෝන් ඕගනික් පුද්ගලික සමාගම	රත්නපුර
11	රෝයල් කැෂූ	ගම්පහ
12	කාල්ටන් ස්වීට් හවුස්, කටාන	ගම්පහ
13	ෆර්ස්ට් ෆර්නිචර්	බණ්ඩාරගම
14	මළිඳු ඩෙයරි ප්‍රඩක්ට්ස්	අඟුණකොළපැලැස්ස

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය

3.2.2. *"දිවියට උදානය" ක්ෂුද්‍ර සහ ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීමේ වැඩසටහන*

දිළිඳුකම පිටුදැකීම සඳහා වන රජයේ ප්‍රතිපත්තිය පදනම් කර ගෙන, විවිධ අමාත්‍යාංශ සහ ආයතනවල සහභාගීත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් දිවියට උදානය ජාතික වැඩසටහන හඳුන්වා දෙන ලද අතර, ක්ෂුද්‍ර හා සුළු කර්මාන්ත අංශය නගා සිටුවීමේ සහ ශක්තිමත් කිරීමේ වැදගත්කම එමගින් අවධාරණය කරන ලදී. මෙම වැඩසටහන යටතේ සෑම මැතිවරණ කොට්ඨාසයක් සඳහා ම රුපියල් මිලියන 2.0 බැගින් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, ඒ හරහා දැනට සිටින සහ නව කර්මාන්තකරුවන්ට තාක්ෂණ සහ කළමනාකරණ පුහුණු සපයා දෙනු ලැබේ.

වගුව 3.2.2: අවශ්‍ය යන්ත්‍රසූත්‍ර මිලදී ගෙන බෙදා හැරීම පිළිබඳ විස්තර

අංකය	විස්තරය	වටිනාකම/සංඛ්‍යාව
01	ව්‍යාපෘතියට සම්බන්ධ දිස්ත්‍රික්ක සංඛ්‍යාව	15
02	බෙදා හරින ලද උපකරණවල වටිනාකම	රු. මි. 114.5
03	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	4,285

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය

3.2.3 කර්මාන්ත ගම්මාන සංවර්ධන ජාතික වැඩසටහන

"කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" යටතේ සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන කර්මාන්ත නගාසිටුවීම පිණිස 2005 වර්ෂයේදී කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම සඳහා වන ජාතික වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ නව යන්ත්‍රසූත්‍ර සහ නිෂ්පාදන ක්‍රියාවලි හඳුන්වා දීම, නවීන ශිල්පීය ක්‍රම සමගින් ප්‍රතිලාභීන් ගේ හැකියා වැඩිදියුණු කිරීම සහ අලෙවිකරණ පහසුකම් සපයා දීම ආදිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. 2016 වර්ෂයේ සිට ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් මෙම ව්‍යාපෘතිය පහත සඳහන් පරිදි වෙන් වෙන් වූ ව්‍යාපෘති දෙකක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

➢ **කාර්මික නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන**

2018 වර්ෂය තුළදී නිෂ්පාදන කර්මාන්ත ගම්මාන වැඩසටහන යටතේ රුපියල් මිලියන 5.0 ක මුදලක් වෙන් කරන ලද අතර පහත සඳහන් ගම්මාන තුන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 6.4 ක මුදලක් වැය කරන ලදී.

- මන්නාරම දිස්ත්‍රික්කයේ අරිප්පු
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ කැලියපුර
- වවුනියාව දිස්ත්‍රික්කයේ කන්නඩිය

➢ **කර්මාන්ත ගම්මාන සහ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

2012 සහ 2013 වර්ෂවල අයවැය යෝජනා මගින් ගම්මාන මට්ටමින් කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සහ ඔවුන්ට සහාය වීම අරමුණු කරමින් කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී.

- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර්
- මඩකලපුව දිස්ත්‍රික්කයේ නාසිවන්තිව්

වගුව 3.2.3: ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ප්‍රගති සාරාංශය

අංකය	ක්‍රියාකාරකම	නිමයුම / ප්‍රධාන කාර්ය සාධන දර්ශක		භෞතික ප්‍රගතිය (සමුච්චිත) සාධනය
1	තාක්ෂණික දැනුම	තාක්ෂණය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක./ වැඩසටහන් සංඛ්‍යාව	248
2	මූල්‍ය සහාය	මූල්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. / ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව	116
3	ඉංජිනේරු සහාය	නව තාක්ෂණය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. සංඛ්‍යාව	38
4	අලෙවිකරණ සහාය	වෙළඳ පොළ සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. සංඛ්‍යාව	110
5	දැනුවත් කිරීමේ වැඩසටහන	දැනුම සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	අනාගත ව්‍යවසායකයින් සංඛ්‍යාව	915
6	ඵලදායීතාවය වැඩිදියුණු කිරීම	ඵලදායීතාවය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. සංඛ්‍යාව	35
7	කළමනාකරණ වැඩිදියුණු කිරීම්	නව කළමනාකරණ ක්‍රමවේදය හඳුන්වා දීම	සු.ම.ක. සංඛ්‍යාව	51
8	අපනයන කාර්ය පටිපාටි පිළිබඳ දැනුම	දැනුම සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. සංඛ්‍යාව	5
9	නිෂ්පාදන ඵලදායීත්වය වැඩිදියුණු කිරීම (තාක්ෂණය වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම්, හැකියා සංවර්ධන, ඇසුරුම්කරණ වැඩිදියුණු කිරීම) සහ අදාළ සහතිකකරණ ලබා ගැනීම සඳහා සහාය වීම (GMP, ISO, SLS සහ අදාළ බලපත්‍ර)	නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම	සු.ම.ක. සංඛ්‍යාව	23

රූපසටහන 3.2.1 : ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2018



3.3 සැලසුම් අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආයතනික ක්‍රමෝපායික සැලැස්ම සැලසුම් කිරීම, සම්පාදනය කිරීම සහ අධීක්ෂණය කිරීම, සහ භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අනුව එක් එක් අංශයේ ක්‍රමෝපායික ක්‍රියාත්මක සැලසුම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් වේ. එමෙන්ම, රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට අනුව, කාර්ය සාධන ඇගයීම්වලට අදාළ තොරතුරු කාලීන වශයෙන් සපයා දෙන ලදී.

<u>වර්ෂය තුළදී නිම කරන ලද කැපී පෙනෙන සිදුවීම්</u>

ව්‍යාපාර අදහසක් හෝ ආකෘතියක් සාර්ථක කර ගැනීමට නම් එම ව්‍යාපෘති ආයතනික අරමුණු සහ අභිමතාර්ථවලට අනුකූල වන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා එම ආයෝජනවල පිරිවැය සහ අනෙකුත් සම්බන්ධතා සලකා බැලීම සහ විශ්ලේෂණය කිරීම අත්‍යාවශ්‍ය වේ. ඉදිරියේ ඇති විය හැකි ගැටළු සහගත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයක් වේ.

3.3.1 පවතින නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීම - (2018 ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ අරමුණෙහි විශේෂ අවධානය)

ශ්‍රී ලංකාවේ සියලුම ව්‍යාපාරවලින් 80% ක පමණ කොටසක් සමන්විත වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි විශාල කොටසකට දායකත්වය සපයා දෙයි. මෙරට ආර්ථිකයට අත්‍යාවශ්‍ය රැකියා අවස්ථා ප්‍රභවයක් වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය මෙරට සේවා නියුක්තියට 35% ක පමණ දායකත්වයක් සපයා දෙයි. මූලික වශයෙන් වසර දෙකක් සඳහා සැලසුම් කර ඇති මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේ සිට සහ 2020 වර්ෂයේ සිට ආරම්භ වන අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, දැනට පවතින කර්මාන්ත මුහුණ දෙන ගැටළු විසඳා ගැනීම සඳහා සහාය සපයා දෙමින් එම කර්මාන්ත සංවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. සංඛ්‍යාලේඛන වලට අනුව, වර්තමානයේ ශ්‍රී ලංකාවේ ව්‍යවසාය 1,100,000 ක් පමණ තිබේ. එම ව්‍යවසාය වලින් 25% ක් පමණ නිෂ්පාදන කර්මාන්ත වන අතර, මෙම ව්‍යාපෘතිය මගින් පළමු වර්ෂයේදී අගය දාම ආකෘතිය භාවිතා කරමින් දිස්ත්‍රික් මට්ටමෙන් කොටස් ලෙස බෙදී පවතින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 500 දෙනෙකුට සහාය ලබා දෙනු ලැබේ.

3.3.2 සංවර්ධන ව්‍යාපෘතිවල/වැඩසටහන්වල ප්‍රගති වාර්තා සකස් කිරීම (මාසික / කාර්තුමය)

3.3.3 ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා සකස් කිරීමට පහසුකම් සැලසීම

3.3.4 ව්‍යවසාය / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත / ආර්ථිකය සම්බන්ධ සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ අදාළ ආංශික සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහාය වීම.

3.3.5 මණ්ඩලයේ සමස්ත කාර්ය සාධනය පිළිබඳ වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

- **භෞතික කාර්ය සාධනය:** ක්‍රියාකාරකම් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ප්‍රතිදාන වශයෙන් කාණ්ඩ දෙකකට වෙන් කර තිබේ.

  ක්‍රියාකාරකම්

  එක් එක් අංශය වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සහ එක් එක් අංශය ඒකාබද්ධව සිදු කරන ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ.

  ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහිත ප්‍රතිදාන

  මෙම කාණ්ඩය යටතේ සමුච්චිත ඉලක්ක සහ සාධනයන්ට අමතරව ඉලක්ක සහ සාධනයන් සඳහන් කර තිබේ.

- **මූල්‍ය ප්‍රගතිය:** ප්‍රාග්ධන අයවැය සහ මණ්ඩලයට අයත් අරමුදල් වලින් දරණ ලද මාසික පිරිවැය සහ සමුච්චිත පිරිවැය ද ඇතුළු මූල්‍ය ප්‍රගතිය මෙයට අයත් වේ. එමෙන්ම, එමගින් ආදායම් කාණ්ඩය යටතේ මාසික ඉලක්ක සහ සාධනයන්, සමුච්චිත ඉලක්ක සහ සාධනයන් සහ විශේෂයෙන් ම ප්‍රගතියෙහි ප්‍රතිශතය ඉදිරිපත් කර ඇත.

3.3.6 2018 වර්ෂයේ ක්‍රියාකාරකම් සමාලෝචනය සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී

ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම්වලට අමතරව, ආයතනික අයවැයට සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමේ කාර්යයට සම්බන්ධ වීම ද සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයක් වේ.

3.4 අලෙවි අංශය

දේශීය කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත වාණිජ වශයෙන් ශක්‍යතා වූ ව්‍යාපාර බවට පුළුල් කර ගැනීම සඳහා සපයා දෙනු ලබන සේවා සහ සහාය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් ඉටු කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයට පැවරී ඇති කාර්යය වේ. එමෙන්ම මෙම අංශය අලෙවිකරණ ක්‍රමෝපාය ස්ථාපිත කර ගැනීම පිණිස කර්මාන්ත හෝ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශක සේවා ද සපයා දෙයි.

කර්මාන්ත ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම, 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සපයා දීම සහ උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම මෙම අංශයට පැවරී ඇති තවත් කාර්යයන් කිහිපයක් වේ. සංවිධානයක් යනු සිය ලාභ මගින් ගනුදෙනුකරුවන් ගේ තෘප්තිමත්භාවය උපරිම මට්ටමට ගෙන ඒම සඳහා සිය ඉලක්ක සපුරා ගැනීම පිණිස පොදු අරමුණක් ඔස්සේ ක්‍රියාකරන සාමාජික දාමයක් වන බැවින් අලෙවි අංශය මණ්ඩලයේ සමස්ත කාර්ය සාධනයට සමගාමී වන පරිදි සිය කාර්යයන් ඉටු කරයි.

3.4.1 අලෙවිකරණ සහාය

අලෙවිකරණ ක්‍රියාකාරකම් යනු කාලය, මුදල් සහ උත්සාහය ආයෝජනය කිරීමක් වේ. එබැවින් ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත අරමුණු සපුරා ගන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහ යම් ක්‍රියාවක් අනෙකුත් ක්‍රියා සමග සංසන්දනය කිරීම සඳහා සෑම ක්‍රියාකාරකමක් ම මැන බැලිය යුතු වේ.

➢ **ලක්කම් අලෙවි මධ්‍යස්ථාන:**

මෙම මධ්‍යස්ථානය සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික නිෂ්පාදනවල ඵලදායීත්වය නගාසිටුවීමේ අරමුණ ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙන අතර ම නැගී එන ව්‍යවසායකයින්ට දේශීය සහ අන්තර්ජාතික වෙළඳ පොළ වෙත ළඟා වීම සඳහා පහසුකම් සලසා දෙයි. විවිධ කාණ්ඩවලට අයත් වන සාම්ප්‍රදායික සහ වෙනත් නිෂ්පාදන සඳහා ප්‍රධාන පෙළේ අලෙවිකරුවෙකු වශයෙන් ලක්කම් අලෙවි මධ්‍යස්ථානය පසුගිය දශක තුනක කාලය පුරා සිය සේවා සපයා දී ඇත. සාපේක්ෂ වශයෙන් සලකා බැලූවිට 2018 වර්ෂය තුළදී මෙම මධ්‍යස්ථානය නව කර්මාන්තකරුවන් 31 දෙනෙකුට වෙළඳ පොළ අවස්ථා සඳහා පහසුකම් සලසා දී ඇති අතර එය වාර්ෂික ඉලක්කය සමග සසඳා බැලීමේදී ඉන් 62% ක් වේ.

➢ **උපකොන්ත්‍රාත් හුවමාරු**

උප කොන්ත්‍රාත් හුවමාරුව යටතේ අලෙවි අංශය කාර්යාලීය ලී බඩු, කාර්යාලීය පුටු සහ සෝෆා, සම් සපත්තු, සෙරෙප්පු සහ බෑග්, රබර් ආශ්‍රිත අමතර කොටස්, ටී-ෂර්ට්, ලිපිද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර සහ ෆයිබර් වැනි තෝරාගත් අයිතම සඳහා කර්මාන්තකරුවන් / සේවා සපයන්නන් වෙනුවෙන් ඇණවුම් ලබා ගැනීම පිණිස මිල ගණන් ඉදිරිපත් කරයි. 2018 වර්ෂය තුළදී උප කොන්ත්‍රාත්කරුවන් 9 දෙනෙකුට වෙළඳ පොළ වෙත ඔවුන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා උප කොන්ත්‍රාත් පහසුකම් සපයා දෙන ලද අතර ප්‍රතිශතයක් ලෙස එය වාර්ෂික ඉලක්කයෙන් 9% ක් වේ.

➢ **ප්‍රදර්ශන**

කාර්මික සංවර්ධන මණ්ඩලය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අනාගත ගනුදෙනුකරුවන් වෙත ළඟාවීමට, ඔවුන් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් සමග එක්ව කටයුතු කිරීමට අවස්ථාව සපයා දීම පිණිස දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමෙන් ප්‍රදර්ශන සංවිධානය කරයි. මෙම අංශයේ ප්‍රගතිය සලකා බැලීමේදී වෙළඳ ප්‍රදර්ශන 6 ක් පවත්වා ඇති අතර සමස්තයක් ලෙස කර්මාන්තකරුවන් 1,925 දෙනෙකු එම ප්‍රදර්ශන වලට සහභාගී වූහ.

3.4.2 අබලි ව්‍යාපෘතිය

කාර්මික සංවර්ධන මණ්ඩලය රාජ්‍ය ආයතනවලින් උත්පාදනය වන යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍ර නොවන ලෝහ අබලි ද්‍රව්‍ය එකතු කර එම අබලි ද්‍රව්‍ය ඇලුමිනියම් සහ පියුටර් ආශ්‍රිත නිෂ්පාදන, තඹ සහ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන, ඊයම් ආශ්‍රිත නිෂ්පාදන, යකඩ ආශ්‍රිත නිෂ්පාදන සහ ලුහු ඉංජිනේරු නිෂ්පාදන ආදී කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන් අතර බෙදා දෙයි. මෙම කර්මාන්තකරුවන් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ විශේෂයෙන් ම ලියාපදිංචි වී සිටින අතර අබලි ද්‍රව්‍ය සහනදායී මිල ගණන් යටතේ එම කර්මාන්තකරුවන් අතර බෙදා දෙනු ලැබේ. 2018 වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේදී, කර්මාන්තකරුවන් 374 දෙනෙකු මෙම ව්‍යාපෘතය යටතේ ප්‍රතිලාභ ලබා ඇති අතර වාර්ෂික ඉලක්කය සමග සැසඳීමේදී එය 94% ක ප්‍රගතියකි.

3.4.3 උපදේශක සේවා

සාමාන්‍යයෙන් වඩාත්ම පිරිවැය ඵලදායී ක්‍රමෝපායයන් දීර්ඝ කාලීන වශයෙන් සැලසුම් කරනු ලැබේ. එයට අමතරව, එක් එක් අංශවල ක්‍රමෝපායික සැලසුම් ආයතනයේ සමස්ත ක්‍රමෝපායික සැලැස්මට මෙන්ම අනෙකුත් දෙපාර්තමේන්තුවල සැලසුම් වලට ද අනුකූල විය යුතු වේ.

ඒ අනුව, වෙළඳ පොළ සහ තරගකාරීකත්වයට අදාළව සමාගමෙහි තත්ත්වය දැනගැනීම වැදගත් වේ. එම නිසා අලෙවි අංශය ඉල්ලීම මත වෙළඳ පොළ වාර්තා සැකසීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සන්නාම සහ ඇසුරුම්කරණය වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් සපයා දීම, සහ වෙළඳ පොළ තොරතුරු සපයා දීම වැනි කාර්යයන් ඉටු කරයි. එමෙන් ම නව වෙළඳ පොළ ප්‍රවනතා පිළිබඳ කාලීනව වැඩමුළු පැවැත්වීම, කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීම සහ හඳුනාගත් ශක්‍ය නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ ශක්‍යතා වාර්තා සකස් කිරීම ද සිදු කරන ලදී.

වගුව **3.4.1 : ප්‍රගති සාරාංශ වාර්තාව – 2018**

අංකය	ක්‍රියාකාරකම	නිමයුම / ප්‍රධාන කාර්ය සාධන දර්ශක		භෞතික ප්‍රගතිය (සමුච්චිත)
				සාධනය
01	උපකොන්ත්‍රාත් පහසුකම් සපයා දීම	වෙළඳ පොළ සඳහා ප්‍රවේශය වැඩිවීම	උප කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව	9
02	කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා දීම (අබලි)	නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩිවීම	කර්මාන්තකරුවන් සංඛ්‍යාව	374
03	වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම	වෙළඳ පොළ සඳහා ප්‍රවේශය වැඩිවීම	සහභාගීවූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	1925
04	ලක්කම් හරහා අලෙවි අවස්ථා සපයා දීම	වෙළඳ පොළ සඳහා ප්‍රවේශය වැඩිවීම	නව කර්මාන්තකරුවන් සංඛ්‍යාව	31



3.5 කාර්මික ජනපද අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික ජනපද අංශය පිහිටුවීමත් සමග මණ්ඩලය කර්මාන්තකරුවන්ගේ (රාජ්‍ය / පෞද්ගලික අංශ) කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහ ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා සුදුසු ඉඩම් කට්ටි නිර්දේශ කරමින් සහ සාදා නිම කළ ගොඩනැගිලි සපයා දෙමින් කර්මාන්ත සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ.

1967 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 296 ක් පමණ වේ. මේ වන විට තිබෙන කාර්මික ජනපදවල පිහිටි ඉඩම් ප්‍රමාණය ඉඩම් කට්ටි හයසිය හතලිස් පහකට (645) බෙදා වෙන් කර ඇති අතර, එම ඉඩම් කට්ටි කර්මාන්තකරුවන් 317 දෙනෙකු අතර බෙදා දී ඇත. සංවර්ධනය කර වෙන් කර දී ඇති මුළු ඉඩම් කට්ටි සංඛ්‍යාවෙන් තවත් ඉඩම් කට්ටි 233 ක මේ වන විටත් කර්මාන්ත ආරම්භ කර ඇති අතර එම කර්මාන්ත තුළින් රැකියා අවස්ථා 7,056 ක් උත්පාදනය වී තිබේ. තවත් ඉඩම් කට්ටි 46 ක කර්මාන්ත ඒකක ඒ සඳහා අවශ්‍ය කර්මාන්ත ශාලා ගොඩනැගිලි ඉදි කිරීමේ විවිධ අදියර වල පවතී. කුඩා කාර්මික ජනපදවල පිහිටි කර්මාන්ත ඒකක 76 ක් මේ වන විට ක්‍රියාත්මක නොවී එම ඉඩම් කට්ටි පදිංචිය සඳහා යොදා ගෙන ඇති බැවින්, එම ගිවිසුම් අවසන් කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබේ. තවද, කර්මාන්ත 60 ක් සඳහා ඉදිකර නිම කර ඇති ගොඩනැගිලි 80 ක් වෙන් කර දී ඇති අතර එම කර්මාන්ත මගින් රැකියා අවස්ථා 1,696 ක් උත්පාදනය කර තිබේ. එයට අමතරව, ප්‍රධාන නගර ප්‍රදේශවලින් බැහැර කර්මාන්ත ස්ථාපිත කිරීම, තදබදය සහිත ප්‍රදේශවල දැනට ක්‍රියාත්මක වන කර්මාන්ත වෙනත් ප්‍රදේශවල ස්ථානගත කිරීම, කුඩා කර්මාන්ත සඳහා උප කොන්ත්‍රාත් අවස්ථා සපයා දීම, සහ පොදු පහසුකම් සපයා දීම හරහා කුඩා කර්මාන්ත ඒකකවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ඇති හැකියාව සොයා බැලීම පිණිස පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම, අධ්‍යයන මගින් සොයාගත් කරුණු වලින් වාර්තා සැකසීම සහ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සිදු කරන ලදී.

වසර 30 ක් පුරා මෙරට පැවති සිවිල් යුද්ධය හේතුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි කාර්මික ජනපදය සම්පූර්ණයෙන්ම විනාශ වූ නිසා ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි උපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ අච්චුවේලි කාර්මික ජනපදය නැවත ඉදිකර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2013 සහ 2014 වර්ෂවලදී ඉන්දියානු රජය විසින් සහ ශ්‍රී ලංකා රජය විසින් පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 220 ක සහ රුපියල් මිලියන 50 ක මූල්‍ය දායකත්වයක් ලබාදෙන ලදී. ඒ අනුව අච්චුවේලි කාර්මික ජනපදය ප්‍රතිසංස්කරණය කර 2014 වර්ෂයේදී කර්මාන්ත කිහිපයක් ආරම්භ කරමින් නැවත වරක් කාර්මික ජනපදයක් ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී.

යටිතල පහසුකම් නොමැතිකම හෝ ප්‍රමාණවත් නොවීම කුඩා පරිමාණ කර්මාන්ත විසින් මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගයක් වන නිසා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් 2018/2019 සංවර්ධන වැඩසටහන අදියර II ක්‍රියාත්මක කර, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහාත්, අච්චුවේලි කාර්මික ජනපදයේ කර්මාන්තකරුවන්ගේ ප්‍රතිලාභය පිණිස 2018/2019 වර්ෂවලදී ඔවුන්ට ලබා දෙන සහනාධාරයක් ලෙස ඔවුන්ගේ මුළු මාසික විදුලිය ගාස්තුවෙන් 50% ක් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහාත් රුපියල් මිලියන 100 ක මුදලක් ප්‍රදානය කරන ලද අතර ඒ සඳහා පිළිවෙලින් රු. මි. 4.5 ක් සහ රු. මි. 8.7 ක් ගෙවන ලදී.

එමෙන්ම, අච්චුවේලි කාර්මික ජනපදයෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියෙහි II වැනි අදියර යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් සපයා දෙන ලද රුපියල් මිලියන 100 ක ආයෝජනය ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ප්‍රදානය කර ඇත. මෙය උතුරු නැගෙනහිර ප්‍රදේශවල පිහිටි දෙවැනි කර්මාන්ත කලාපය වේ. තවද, මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් උතුරු පළාතේ සිටින කර්මාන්තකරුවන්ට අලුතින් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා නව ජීවයක් සපයා දෙනු ඇත.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජූලි - සැප්තැම්බර්)

2018 වර්ෂය තුළදී ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

කාර්මික ජනපද අංශය විසින් දැනට තිබෙන යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වන කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ රේඛීය අමාත්‍යාංශය හරහා රජයේ භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද රු. මි. 78.1 ට ආසන්න මුදල එම ක්‍රියාකාරකම් සඳහා වැය කර ඇත. මෙරට තිබෙන සුළු පරිමාණ කර්මාන්තවල වර්ධනය වැඩි දියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වලට ඇතුළත් වේ. ප්‍රධාන වශයෙන් ම මේ සඳහා රාජ්‍ය හිමිකාරීත්වය සහිත ඉදිකිරීම් ආයතනවල දායකත්වය ලබා ගෙන ඇති අතර එම ව්‍යාපෘති වලින් බොහෝමයක් 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පවතී.

වගුව **3.5.1:** ව්‍යාපෘතියට අදාළ එක් එක් ක්‍රියාකාරකමෙහි පිරිවැය ඇස්තමේන්තුව

අංකය	කාර්මික ජනපදය	ක්‍රියාකාරකම	ඇස්තමේන්තුව (රු.)	2017 වර්ෂයේ ලැබුණු අරමුදල් (රු.)	2018 වර්ෂයේ ලැබුණු අරමුදල් (රු.)	ශේෂය (රු.)	ප්‍රගතිය (%)
01	පල්ලෙකැලේ	කාණු සහ පදික වේදිකා ඉදි කිරීම සහ පවතින මායිම් වැට අලුත්වැඩියා කිරීම.	16,397,744.20	9,698,353.02	896,190.02		100%
02	ගලිගමුව	කාණු, වැට සහ පොම්පාගාරය ඉදිකිරීම සහ පවතින මාර්ගය අලුත්වැඩියා කිරීම	15,517,037.00	6,977,537.50	2,614,059.85		100%
03	පුස්සැල්ල	මායිම් වැටෙහි කොටසක් ඉදිකිරීම	4,711,000.00		2,057,207.82		100%
04	පානළුව	මායිම් තාප්පය ඉදිකිරීම	20,763,250.00	3,140,000.00	3,668,669.46	13,290,762.39	35%
05	අච්චුවේලි	ට්‍රාන්ස්ෆෝමරය සවි කිරීම	2,980,000.00	2,980,000.00			100%
		ට්‍රාන්ස්ෆෝමර් කාමරය ඉදිකිරීම	88,000.00		88,000.00		100%
		විශාල ළිඳක් ඉදිකිරීම සහ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල සහ කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම	3,835,250.00	767,050.00	1,430,898.76	1,637,701.24	55%
06	නැගම්පහ	නළ ළිඳක් ඉදිකිරීම	928,705.50		928,705.50		
එකතුව				**23,562,940.52**	**11,683,731.41**	**14,928,463.63**	

වගුව 3.5.2: ව්‍යාපෘතියෙහි ප්‍රගතිය

අංකය	කාර්මික ජනපදය	ක්‍රියාකාරකම	ඇස්තමේන්තුව (රු.)	මූල්‍ය ප්‍රගතිය			ප්‍රගතිය (%)
				2016 සහ 2017 වර්ෂවල ලැබුණු අරමුදල් (රු.)	2018 වර්ෂයේ ලැබුණු අරමුදල් (රු.)	ශේෂය (රු.)	
01	කළුදැවල	අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදිකිරීම	39,599,966.71	17,216,985.53	17,509,229.94	3,355,189.90	100%
02	පන්නල	ට්‍රාන්ස්ෆෝමරයසවි කිරීම	2,749,846.94	2,749,846.94			100%
		2 වැනි අදියර සංවර්ධනය කිරීම	76,672,395.09	15,334,478.50	13,919,597.63	45,418,315.96	90%
03	හොරණ	අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ කාණු ඉදි කිරීම	12,000,000.00	5,500,000.00	5,055,097.39	555,531.44	100%
04	පල්ලෙකැලේ	අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම සහ මායිම් වැට ඉදි කිරීම	35,707,877.16	16,084,629.35	11,413,836.50	4,005,136.95	90%
05	කොටගල	අභ්‍යන්තර මාර්ග සහ වැසිකිලි ඉදිකිරීම සහ ප්‍රධාන දොරටුව අලුත්වැඩියා කිරීම	4,518,869.50	1,964,725.88		2,554,143.62	90%
06	පුස්සැල්ල	අභ්‍යන්තර මාර්ග සහ කාණු ඉදිකිරීම	7,910,738.49	1,149,430.03	6,718,816.63		100%
07	වවුනියාව	අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම	10,000,000.00	5,000,000.00	5,186,113.39		100%
08	ඒකල	අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම	31,000,000.00	15,500,000.00	6,615,201.19	1,193,355.78	100%
		මලාපවහන මාර්ගයේ ඉතිරි කොටස ඉදි කිරීම	5,525,432.26	5,526,432.26			100%
09	නැගම්පහ	ට්‍රාන්ස්ෆෝමරය සවි කිරීම	2,756,161.62	2,756,161.62			80%
		ඉඩම එළිපෙහෙලි කිරීම සහ වැට ඉදිකිරීම	5,128,826.25	3,826,821.43		1,488,497.76	98%
10	බුත්තල	අභ්‍යන්තර මාර්ග සහ කාණු සහ මායිම් වැට ඉදිකිරීම	22,122,500.00	16,591,875.00		1,793,228.65	98%
එකතුව				**109,201,386.54**	**66,417,892.67**	**60,363,400.06**	

➢ **කර්මාන්ත ඒකක සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම**

මෙම වර්ෂය තුළදී කර්මාන්ත ඒකක ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර තිබූ, කර්මාන්ත ඒකකවල මේ වන විට කර්මාන්ත පවත්වා ගෙන යන සහ අලුතින් ඉඩම් කට්ටි / ඉදිකර නිම කර ඇති ගොඩනැගිලි ලබා ගැනීමට අපේක්ෂා කරන නව ආයෝජකයින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන ලද අතර, එම කර්මාන්තවල ශක්‍යතාවය සැලකිල්ලට ගනිමින් කර්මාන්තකරුවන් 30 දෙනෙකු තෝරා ගන්නා ලදී.

වගුව 3.5.3 : 2018 වර්ෂයේදී ඉඩම් වෙන් කර දෙන ලද සහ ආරම්භ කරන ලද කර්මාන්ත

අංකය	කාර්මික ජනපදය	ඉඩම් කට්ටි / ගොඩනැගිලි වෙන් කර දීම	අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත	
			කර්මාන්ත	රැකියා සංඛ්‍යාව
01	පල්ලෙකැලේ	7	4	169
02	හොරණ	1		
03	බුත්තල	1		
04	පුස්සැල්ල	3	1	8
05	පන්නල	2	1	15
06	පානළුව	2	3	45
07	වවුලුගල	2	2	26
08	කොටගල	1		
09	ගලිගමුව	1		
10	අච්චුවේලි	2		
11	ඒකල	-	4	103
12	කළුදැවල	-	1	20
	එකතුව	**22**	**16**	**386**

➢ **කල්බදු ගිවිසුම් අත්සන් කිරීම**

සතුටුදායක මට්ටමෙන් ව්‍යාපාර කටයුතු සිදු කළ අදාළ කර්මාන්තකරුවන් සමග ඉඩම් සහ ඉදිකර නිම කළ ගොඩනැගිලි සඳහා පිළිවෙලින් වසර 30 ක සහ වසර 20 ක කාල පරිච්ඡේද සඳහා වන කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව, 2018 වර්ෂයේදී අදාළ කර්මාන්තකරුවන් සමග කල්බදු ගිවිසුම් 29 ක් අත්සන් කර එමගින් රු. 409,030.74 ක මුදලක් අය කර ගැනීමට හැකි විය.

වගුව 3.5.4 : ආදායම් අය කර ගැනීම

අංකය	විස්තරය	මුදල
01	කුලිය - කාර්මික ජනපද ගොඩනැගිලි	21,095,614.75
02	අමතර ගොඩනැගිලි තක්සේරු ගාස්තු	204,156.00
03	කුලිය - කාර්මික ජනපදවල සංවර්ධනය කරන ලද ඉඩම් කට්ටි	38,535,269.91
04	කුලිය - අමතර භූමි	1,844,376.66
05	ජල ගාස්තු	6,563,329.42
06	අධි අය	1,639,626.31
07	රක්ෂණ වාරික	46,587.24
	එකතුව	**69,928,960.29**


සු.ම.ක .කාර්මික ජනපද
ප්‍රධාන සු.ම.ක .කාර්මික ජනපද
කුඩා සු.ම.ක .කාර්මික ජනපද
අච්චුවේලි (යාපනය)
පූන්තෝන්ඩාම් (වවුනියාව)
නෑගම්පහ (අනුරාධපුරය)
ලුණුවිල (පුත්තලම)
පන්නල (කුරුණෑගල)
ඒකල (ගම්පහ)
පානළුව (කොළඹ)
හොරණ (කළුතර)
(වවුළුගල)කළුතර
මිහින්තලේ (අනුරාධපුරය)
කළුදෑවල (මාතලේ)
පල්ලෙකැලේ (මහනුවර)
ගලිගමුව (කෑගල්ල)
කොටගල (නුවරඑළිය)
බුත්තල (මොණරාගල)
පුස්සැල්ල (රත්නපුර)
බද්දේගම (ගාල්ල)
බෙලිඅත්ත (හම්බන්තොට)
Jaffna
Kilinochchi
Mullaithivu
Mannar
NORTHERN
Vavuniya
NORTH CENTRAL
Trincomalee
Anuradhapura
Puttalum
Polonnaruwa
EASTERN
Batticaloa
NORTH WESTERN
CENTRAL
Kurunegala
Matale
Kandy
Ampara
Kegalle
Gampaha
Nuwara Eliya
Badulla
Colombo
Monaragala
Rathnapura
UVA
Kalutara
WESTERN
SABARA-GAMUWA
SOUTHERN
Galle
Matara
Hambantota

3.6 ඉංජිනේරු අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මෙරට තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා මණ්ඩලයෙහි දැක්ම ක්‍රියාත්මක කිරීමට දායක වන ප්‍රමුඛතම අංශය ලෙස ක්‍රියාත්මක වෙයි. එමෙන්ම මෙම අංශය කර්මාන්තකරුවන්ට තිබෙන සීමිත සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් උපයෝජනය කර ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස තාක්ෂණික සහ මෙහෙයුම් ධාරිතාව වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය සහාය සපයා දෙයි. එයට අමතරව මෙම අංශය ලෝහ සහ ලෝහ නොවන නිෂ්පාදන / කර්මාන්තකරුවන් නිෂ්පාදනය කරන භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධ මූලික සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) පිළිබඳ අධ්‍යයන සිදු කරයි. එමෙන්ම උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම, කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා සහ ඇගයීම් වාර්තා සකස් කිරීම, සහ ලෝහ අබලි ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම පිණිස දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු වැඩපොළ පහසුකම් වැඩිදියුණු කිරීම මෙම අංශය විසින් සපයා දෙනු ලබන තවත් සේවා කිහිපයක් වේ.

අදාළ ඉලක්ක සපුරා ගැනීම පිණිස ඉංජිනේරු අංශය යටතේ පහත සඳහන් ඒකක ක්‍රියාත්මක වේ:

(අ). කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළ, ඉංජිනේරු වාත්තු වැඩපොළ, අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලය, (තාක්ෂණික තොරතුරු සහ උපදේශක සේවා, සහ තක්සේරු වාර්තා ආදිය සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු සේවා යන අංශ මෙයට අයත් වේ.

(ආ). විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ

(ඇ). යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - පන්නල

(ඈ). පොදු සේවා මධ්‍යස්ථානය - මාතර

(ඉ). පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව

ඉහත සඳහන් කළ සේවා ඒකකවලට අමතරව, තිරසර සංවර්ධනය උදෙසා දේශීය කර්මාන්තවලට අපේක්ෂිත අගය එකතු කළ සේවා සපයා දීම පිණිස පහත සඳහන් ඒකක ඉතා වැදගත් වේ:

- නිර්මාණ සහ සංවර්ධන ඒකකය:

කර්මාන්ත අවශ්‍යතා හඳුනා ගැනීම සහ කර්මාන්තවල තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ නිෂ්පාදන පහසුකම් නිර්මාණය කිරීම සහ තිරසර ආකාරයකින් ඒවා ක්‍රියාත්මක කිරීම මෙම ඒකකයට පැවරී ඇති කාර්යයන් වේ.

- ඇගයීම් සහ ලෝහ ආශ්‍රිත කර්මාන්ත දත්ත විශ්ලේෂණ ඒකකය:

ශ්‍රී ලංකාව තුළ පිරියත, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම, ඇගයීම සහ තත්ත්ව වාර්තා සකස් කිරීම.

වගුව 3.6.1 : ඉංජිනේරු අංශයෙහි ප්‍රගතිය 2018

අංකය	අංශය / ඒකකය	ආදායම (රු.)
2018 වර්ෂයේදී නිම කරන ලද සේවා සඳහා බාහිරින් ලැබුණු ආදායම		
01	ඉංජිනේරු සහ පරිපාලන කාර්ය මණ්ඩල ඒකකය	3,479,699.49
02.	යාන්ත්‍රික වැඩපොළ	3,601,334.09
03.	වාත්තු ඒකකය	4,040,307.70
04.	යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, පන්නල.	4,700,691.95
05.	විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය, පෑලියගොඩ.	2,164,667.36
06.	පොදු සේවා මධ්‍යස්ථානය, මාතර.	1,655,981.62
07.	වාත්තු සේවා මධ්‍යස්ථානය - පිළිමතලාව.	442,921.09
එකතුව		**20,085,603.30**
අභ්‍යන්තර සේවා		
01.	යාන්ත්‍රික වැඩපොළ	1,308,752.02
02.	වාත්තු ඒකකය	758,886.09
03.	සිවිල් නඩත්තු ඒකකය	2,763,676.94
04.	විදුලි නඩත්තු ඒකකය	1,098,802.80
එකතුව		**5,930,117.85**



රූපසටහන 3.6.1 : ඉංජිනේරු අංශය විසින් සපයා දෙන ලද සේවා 2018

<u>තාක්ෂණය වැඩි දියුණු කිරීම් සහ සංවර්ධනය කිරීම</u>

(i) ලෝහ විද්‍යා රසායනාගාරය

ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා වාත්තු වැඩපොළ පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස 2018 වර්ෂය තුළදී මෙම අංශය අලුතින් ලෝහ විද්‍යා රසායනාගාර උපකරණ මිලදී ගෙන හඳුන්වා දෙන ලදී.

ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය (Optical Emission Spectrometer)

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය

➢ **ලෝහ විශ්ලේෂණය**

වැඩිදියුණු කළ විශ්ලේෂණ ක්‍රියාකාරීත්වය, වඩා වැඩි විමර්ශන නම්‍යශීලීත්වය සහ සරල ක්‍රියාකරවීම යන විශේෂත්වයන් සහිත ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය නව ලෝහ විශ්ලේෂක පංතියක් නියෝජනය කරයි. උද්දීපන මූලාශ්‍රය විශ්ලේෂණය කිරීම, ප්‍රකාශ සහ තොරතුරු ප්‍රදර්ශනය සඳහා වඩාත්ම වැදගත් වන උපාංග සමූහය ඉතාමත් යෝග්‍ය ලෙස එකිනෙකට අනුගත වෙයි. එය ක්‍රියාකාරීත්වය සහ නම්‍යශීලීත්වය ඒකාබද්ධ කරන නව චාප/පුළිඟු විශ්ලේෂක පරම්පාරාවෙහි උසස්තම විශ්ලේෂණ මූලිකාංගය වේ. මෙම යන්ත්‍රය තුනී තහඩු සහ කුඩා කූරු පරීක්ෂා කර බැලීම සඳහා වන විශේෂ සම්බන්ධක උපාංගයකින් සමන්විත වේ. මෙම නව විශ්ලේෂකය මගින් ක්ෂණයකින් වානේ, යකඩ, ඇලුමිනියම්, තඹ සහ තුත්තනාගම් ආශ්‍රිත ලෝහ වල අඩංගු සියලුම ප්‍රධාන සංරචක නිවැරදිව විශ්ලේෂණය කිරීම සඳහා සහ මූලද්‍රව්‍ය සොයා ගැනීම සඳහා පහසුකම් සලසයි.

➢ **ලෝහ විද්‍යා රසායනාගාරයෙන් ලබා ගත හැකි අනෙකුත් ලෝහ විද්‍යා පහසුකම්**

ලෝහ විද්‍යාත්මක පරීක්ෂණ	- ලෝහ සඳහා කාබන් විශ්ලේෂණ පරීක්ෂාව - දෘඩත්ව පරීක්ෂාව - දික්ගැසීම පරීක්ෂාව - නැමීම පරීක්ෂාව
ලෝහ ව්‍යුහ විද්‍යාත්මක පරීක්ෂණය	- ලෝහ ආතත්‍ය පරීක්ෂාව සඳහා ක්ෂුද්‍ර ව්‍යුහ පරීක්ෂාව
වාත්තු අච්චු වැලි පරීක්ෂාව	- තෙතමනය පරීක්ෂාව - පාරගම්‍යතාව පරීක්ෂාව - සම්පීඩනය පරීක්ෂාව - කණිකා ප්‍රමාණ ව්‍යාප්ති පරීක්ෂාව - සමස්ත මැටි අන්තර්ගතය පරීක්ෂාව - සක්‍රිය මැටි අන්තර්ගතය පරීක්ෂාව

3.7 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය යනු දැනට තිබෙන කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපාය හඳුන්වාදීම මගින් නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ස්ථාපිත කර ඇති විශේෂ පුහුණු අංශයක් වේ. ව්‍යවසායකත්වය රටෙහි ආර්ථික සංවර්ධනය සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රබල කාර්ය භාරයක් ඉටු කරයි. ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්වය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල මනා සේවා ස්ථාන පරිචයන් අනුගත කර ගැනීම ප්‍රවර්ධනය කරන හැකියා සංවර්ධනය සහ පුහුණු සම්පත් හරහා ව්‍යවසායකත්ව කළමනාකරණ කුසලතා ශක්තිමත් කිරීමට හේතු වෙයි. දේශීය කර්මාන්තකරුවන් වෙත තාක්ෂණ දැනුම සහ ව්‍යාපාර අත්දැකීම් සපයා දීම, උපදේශක සේවා සපයා දීම, සහ දේශීය කර්මාන්තවලට කර්මාන්ත තොරතුරු සහ ව්‍යාපාර අත්දැකීම් සපයාදීම මෙම අංශය මගින් සපයා දෙනු ලබන අනෙකුත් සේවා වලින් කිහිපයක් වේ.

වගුව **3.7.1** :ප්‍රගති සාරාංශය - 2018

අංකය	ක්‍රියාකාරකම	කාර්ය සාධන දර්ශකය	භෞතික ප්‍රගතිය සාධනය
01	ඵලදායීතාවය ක්‍රියාත්මක කිරීම	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	4
		කර්මාන්ත / ආයතන සංඛ්‍යාව	4
02	පුහුණු වැඩසටහන් පැවැත්වීම (ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවිකරණ සහ මූල්‍ය කළමනාකරණ ආදිය)	පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	7
		ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	161
03	ව්‍යවසායකයින්/කර්මාන්තකරුවන්/ රජයේ සහ බාහිර ආයතන සඳහා අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම	කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාවයට අනුව සකස් කර පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව	12
		ප්‍රතිලාභ ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව	298



ව්‍යවසායකත්වය සහ ස්වයං රැකියා සඳහා තිබෙන අවස්ථා සහ අභියෝග පිළිබඳ තරුණ පරම්පරාව තුළ ඇති දැනුවත් භාවය වැඩි දියුණු කිරීම මගින් රටෙහි / සමාජයෙහි ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා මෙම අංශය දායකත්වය ලබා දෙයි. කර්මාන්තවල ඉහළ ඵලදායීත්වයක් සහ තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ආයතනවල ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම පිණිස මෙම අංශය විසින් සංවිධානය කරනු ලබන අනෙකුත් වැඩසටහන් කිහිපයක් පහත දක්වා ඇත.

➢ **කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල සඳහා ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

මෙම වර්ෂයේ ජූලි මාසය තුළදී ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය විසින් හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික් කාර්යාලවලදී ඵලදායීතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. දිස්ත්‍රික් කාර්යාලවල ඵලදායීතාවය ඉහළ නැංවීම සහ සේවා අංශ කාණ්ඩය යටතේ ජාතික ඵලදායීතා තරගාවලියට අයදුම් කිරීමට දිස්ත්‍රික් කාර්යාල දිරිමත් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු විය.

➢ **මහවැලි ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන**

තඹුත්තේගම මහවැලි ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කාර්යයන් වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහනක් මෙම අංශය විසින් 2018 මාර්තු මස 11 වැනි දින සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනෙහිදී ප්‍රායෝගික ව්‍යාපාර අත්දැකීම් සමගින් මූලික වශයෙන් අලෙවිකරණය, පිරිවැයකරණය, වාර්තා තබා ගැනීම සහ ව්‍යාපාර සැලසුම් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලදී.

3.8 තාක්ෂණ සේවා අංශය

තාක්ෂණ සේවා අංශය නැගී එන කර්මාන්තකරුවන් සඳහා කර්මාන්ත පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ ඵලදායීත්වය ඉහළ නැංවීම සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණ සහාය සපයා දී ඇත. එයට අමතරව මෙම අංශය ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාවයට අනුව ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන අංශ පදනම් කර ගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපදේශක සේවා සපයා දීම සහ මාර්ගෝපදේශනය සපයා දීම සිදු කරයි. තාක්ෂණ සේවා සපයා දීමේදී හැකි උපරිම කාර්යක්ෂම, ඵලදායී සහ නවෝත්පාදන ක්‍රම වලින් භෞතික සහ අර්ථවත් තොරතුරු ලබා ගැනීම, සංවිධානය කිරීම, සංරක්ෂණය කිරීම, පවත්වාගෙන යාම සහ එම තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය සපයා දීම මගින් නැගී එන කර්මාන්තකරුවන්ට සහාය දීම අරමුණු කරන ලදී. නැගී එන ව්‍යවසායකයින්ගේ විශේෂිත අවශ්‍යතා ඉටු කර දීම පිණිස තාක්ෂණ සේවා අංශය 2018 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී එම අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි ප්‍රධාන ක්‍රියාකාරකම් සැලසුම් කරන ලදී.

2018 වර්යේදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් පරිදි වේ:

3.8.1 දේශීය සහ විදේශීය තාක්ෂණයන් ලබා ගැනීම

➢ **"සගන්ධ තෙල්, සුවඳ විලවුන් නිෂ්පාදනය සහ ශාකාශාර ප්‍රතිකාර නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන - FFDC, කන්නාඋජ්, ඉන්දියාව.**

ඉන්දියාවේ ෆ්‍රේග්‍රන්ස් ඇන්ඩ් ෆ්ලේවර් ඩිවලොප්මන්ට් සෙන්ටර් (FFDC) සමග එක්ව කාර්මික සංවර්ධන මණ්ඩලය ඉන්දියවේදී "සගන්ධ තෙල්, සුවඳ විලවුන් නිෂ්පාදන සහ ශාකශාර ප්‍රතිකාර නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත් වූයේය. ඖෂධීය සහ සුගන්ධ ශාක නිෂ්පාදනවල අගය එකතු කිරීම ද ඇතුළුව සගන්ධ තෙල් මූලික සහ උසස් සැකසුම් කිරීම පිළිබඳ පරිපූර්ණ දැනුමක් සපයා දීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. තවද, මෙම පුහුණු වැඩසටහන මගින් වැඩිදුර දැනුම ලබා ගැනීම සඳහා පමණක් නොව, ව්‍යාපාර සම්බන්ධතා ගොඩනගා ගැනීම සහ ජාලකරණය සඳහා ද උපකාරී වූ හරවත් වේදිකාවක් සපයා දෙන ලදී. මෙම පුහුණු සැසිය තුළදී ආසවනය කිරීමේ ශිල්පීය ක්‍රම, සුගන්ධ අමු ද්‍රව්‍යවල ගුණාත්මක භාවය තක්සේරු කිරීම, සුගන්ධය සහ රසය ඇති කිරීම, විවිධ නිෂ්පාදනවල සුගන්ධය යොදා ගැනීම සහ ශාඛශාර ප්‍රතිකාරවලදී සගන්ධ තෙල් යොදා ගැනීම ආදී ක්ෂේත්‍ර ආවරණය කරන ලදී. එමෙන්ම FFDC ආයතනයේ නියමු යන්ත්‍රාගාර තුළදී ඔලියොරෙසින් නිෂ්පාදනය, මල් වලින් තෙල් පෙරා ගැනීම (මල්වලින් සුගන්ධ තෙල් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය), සහ ජල සහ හුමාල ආසවන තාක්ෂණික ක්‍රම පිළිබඳව ප්‍රායෝගික නිරූපණ ද සිදු කරන ලද අතර සහභාගීවූවන්ට එම නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳ සෘජුවම ප්‍රායෝගික දැනුම සපයා දෙන ලදී. එපමණක් නොව, එම පුහුණු වැඩසටහනට සහභාගී වූ කර්මාන්තකරුවන්ට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පිණිස ඉන්දියාවේ ලක්නව් හි පිහිටි ජාතික උද්භිද විද්‍යා පර්යේෂණ ආයතනය සහ ෆ්‍රේග්‍රන්ස් ඇන්ඩ් ෆ්ලේවර් ඇසෝසියේෂන් ඔෆ් ඉන්දියා වැනි එම ක්ෂේත්‍රයට අදාළ ආයතන සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට ද හැකි විය.

3.8.2 නිෂ්පාදන / ක්‍රියාවලි සංවර්ධනය කිරීම සඳහා සහාය

➢ **බස්නාහිර පළාතේ සුළු පරිමාණ රසායනික ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන නියමු ව්‍යාපෘතිය - 2018**

බස්නාහිර පළාතේ සාර්ථක මට්ටමෙන් ක්‍රියාත්මක වූ සුළු පරිමාණ රසායනික ද්‍රව්‍ය කර්මාන්ත දොළහක් සංවර්ධනය කිරීම සඳහා එම කර්මාන්තවල ගුණාත්මක භාවය සහ ඵලදායිත්වය වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයෙන් කොටසක් ප්‍රදානය කරමින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය රසායනික ද්‍රව්‍ය කර්මාන්තයේ සමස්ත කාර්ය සාධනය වැඩි දියුණු කිරීම පිණිස නියමු ව්‍යාපෘතියක් හඳුන්වා දුන්නේය. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරා ගන්නා ලද කර්මාන්ත විසින් ඒවායෙහි නිෂ්පාදන සහ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම පිණිස අවම වශයෙන් රු. 600,000/- ක් ආයෝජනය කළ යුතු වූ අතර, ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව කාර්මික සංවර්ධන මණ්ඩලය රු. 300,000/- ක උපරිමයකට යටත්ව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් (උපදේශක සේවා ගාස්තු සහ කර්මාන්තශාල නවීකරණ වියදම් හැර) 50% ක් ප්‍රතිපූරණය කළේය. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගන්නා ලද කර්මාන්ත 11 න් පහත සඳහන් කර්මාන්ත අට 2018 දෙසැම්බර් මාසය වන විට සිය ව්‍යාපෘති සාර්ථකව නිම කළහ. ලේටෙක්ස් ලංකා ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම, ග්‍රෙස්ටොන් කෙමිකල්ස් (පුද්) සමාගම, ආර්.වයි.සී. කලර් (පුද්) සමාගම, බයෝ න්‍යුට්‍රි ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම, ධනුෂක ජේන්ට්ස් ඇන්ඩ් කෙමිකල්ස් (පුද්) සමාගම, නෙස්ට්කෙම් ලංකා (පුද්) සමාගම, සිල්වර් ස්ටාර් ඉන්ඩස්ට්‍රීස් සහ යුනික් මල්ටි ආර්ටිස්ට්.

➢ **ශ්‍රී ලංකාවේ සවිබල ගැන්වූ ෆයිබර් ග්ලාස් නිෂ්පාදනවල අපනයන විභවතාවය වැඩි දියුණු කිරීම**

ශ්‍රී ලංකාවේ ෆයිබර් ග්ලාස් කර්මාන්තය අංශයට අලුතින් එකතු වන කර්මාන්තකරුවන් දිරිගැන්වීම පිණිස සහ දැනට තිබෙන කර්මාන්තවල අපනයන විභවතාවය වැඩි දියුණු කිරීම පිණිස තාක්ෂණ සේවා අංශය පානදුර පිහිටි බෝට් බිල්ඩිං ටෙක්නොලොජි ඉම්ප්‍රෑව්මන්ට් ඉන්ස්ටිට්‍යූට් ලංකා (පුද්) සමාගම සමග සාකච්ඡා කර තෙදින පුහුණු වැඩසටහනක් සාර්ථක ලෙස පවත්වන ලදී.

➢ **නිෂ්පාදන සංවර්ධන කටයුතු**

ශ්‍රී ලංකාවේ දකුණු මුහුදු තීරයේ සුලභව තිබෙන අල්වා ලැක්ටියුකා මුහුදු පැලෑටිය බේකරි නිෂ්පාදනවලට යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමග එක්ව උපාධි අපේක්ෂක සිසුන් විසින් පර්යේෂණයක් සිදු කරන ලදී. එමෙන්ම, තාක්ෂණ සේවා අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් හරහා සහල් සහ කොස් ඇට ආශ්‍රිත රොටී, ග්‍රීන් ටී (“මැච” පිටි) ආශ්‍රිත බිස්කෝතු සහ බෝතල් කළ බණ්ඩක්කා නිෂ්පාදනය කරන ලදී.

3.8.3 කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනය අතර අවබෝධතා ගිවිසුම

2018 පෙබරවාරි 21 වැනි දින කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ලංකා ප්ලාස්ටික හා රබර් ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ශ්‍රීලංකා ප්ලාස්ටික සහ රබර් ආයතනය ප්ලාස්ටික් සහ රබර් ක්ෂේත්‍රයේ කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහාය වීම පිණිස පිහිටුවා ඇති ජාතික වෘත්තීයවේදී ආයතනය වේ. මෙම අවබෝධතා ගිවිසුම හරහා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල හඳුනාගත් අඩුපාඩු සම්පූර්ණ කර දීම සඳහා පරිපූර්ණ තාක්ෂණ අවශ්‍යතා ඇගයීමක් සිදු කිරීමට සහ අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ඇත.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජනවාරි - මාර්තු)

3.8.4 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුම (ලක්සල)

2018 මාර්තු මස 23 වැනි දින කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ මෙන් ම තරුණ ප්‍රජාවගේ ද පුහුණු අවශ්‍යතාවයන් සපුරා දීම සඳහා මෙම අවබෝධතා ගිවිසුම යටතේ දැව තාක්ෂණය පිළිබඳ හැකියා සංවර්ධන පුහුණුවක් සපයා දීමට අරමුණු කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ලක්සල ආයතනය මෙලෙස එකට එක්වීම තුළින් දැව කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ඉමහත් සේවාවක් සපයා දිය හැකි බව හඳුනා ගන්නා ලදී.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජනවාරි - මාර්තු)

දැව කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ප්‍රධානතම ගැටළුව පුහුණු ශ්‍රමය නොමැති වීම බව කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ලක්සල යන දෙපාර්ශ්වය ම හඳුනා ගෙන ඇති අතර, එම නිසා ලක්සල ආයතනය සතුව මේ වන විටත් තිබෙන ගොඩනැගිලි සහ යන්ත්‍රසූත්‍ර යොදා ගනිමින් කටුබැද්ධ ප්‍රදේශයේ දැව කර්මාන්ත ආශ්‍රිත පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. මෙරට තරුණ පරපුර දැව කර්මාන්ත අංශයට ආකර්ෂණය කර ගනිමින් ඔවුන්ට එම ක්ෂේත්‍රයේ කුසලතා අත්කර ගැනීමට පහසුකම් සැලසීම තුළින් දේශීය සහ අන්තර් ජාතික මට්ටමෙන් දැව ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා උදා කර ගැනීමට ඔවුන්ට අවස්ථාව සපයා දීම මෙම යෝජිත පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ අරමුණ වේ.

එමෙන්ම, මේ වන විට පුහුණු ශ්‍රමය හිඟකම නිසා දැව කර්මාන්ත අංශය ගැටළුවලට මුහුණ දී තිබේ. එම නිසා ශ්‍රී ලාංකිකයින්ගේ අවශ්‍යතා ඉටු කර දීම පිණිස ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටමේ පාඨමාලා පැවැත්වීම මගින් නව ඉගෙනුම් අවස්ථා සපයා දීම මෙම මධ්‍යස්ථානයේ මෙහෙවර වේ. ගොඩනැගිලි සහ ලී බඩු අංශ ආශ්‍රිත දැව ශිල්පය ශ්‍රී ලංකාවේ දැව කර්මාන්තයේ ප්‍රධානතම විභව්‍ය ක්ෂේත්‍ර වේ. එම නිසා මෙම ව්‍යාපෘතිය තුළින් වඩා ඉහළ ජාතික ආදායමක් උපයා ගැනීම සහතික කරමින් ඉහළ අගය එකතු කිරීමේ සහ ඉහළ ඵලදායිතා වේදිකාවක් සපයා දෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

මෙම ව්‍යාපෘතියෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ගොඩනැගිලි සහ ලී බඩු සඳහා දැව ශිල්පීය නිපුණතාවය වැනි දැව තාක්ෂණය පිළිබඳ හැකියා සංවර්ධන පුහුණුව සපයා දීම.
- රාජ්‍ය ආයතන සඳහා ලීබඩු නිෂ්පාදනය කිරීම සහ සපයා දීම.
- කර්මාන්තකරුවන් සඳහා නව යන්ත්‍රසූත්‍ර සහ නවීන තාක්ෂණය හඳුන්වා දීම.
- දැව පිරියම් කිරීම සහ පෝරණු මගින් වියළීම සඳහා පහසුකම් සපයා දීම; සහ
- දැව කර්මාන්ත අංශය සඳහා නව නිෂ්පාදන සහ නව මෝස්තර හඳුන්වා දීම.

3.8.5 සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීම

තාක්ෂණ සේවා අංශය තුළ සහ ඉන් පිටතදී කර්මාන්තකරුවන් 374 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන් 14 ක් පවත්වන ලදී.

වගුව **3.8.1 :** සේවාදායක අවශ්‍යතාවය අනුව සකස් කළ පුහුණු වැඩසටහන්

අංකය	වැඩසටහනෙහි නම	අරමුදල් සැපයූ ආයතනය
01	"යෝගට්, මුදවාපු කිරි සහ සහල් ආශ්‍රිත නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන - කන්දකාඩු (2018 ජනවාරි 3 – 5)	පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාලය
02	"බේකරි නිෂ්පාදන තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන - කන්දකාඩු (2018 ජනවාරි 22–24)	පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාලය
03	"චට්නි සහ අච්චාරු" පිළිබඳ පුහුණු වැඩසටහන - මාලිගාවත්ත (2018 ජනවාරි 25)	මුස්ලිම් ඒඩ් ශ්‍රී ලංකා
04	"බේකරි නිෂ්පාදන තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන - මාලිගාවත්ත (2018 පෙබරවාරි 08)	මුස්ලිම් ඒඩ් ශ්‍රී ලංකා
05	"බේකරි නිෂ්පාදන තාක්ෂණය" (කප් කේක් සහ උපන්දින කේක්) පිළිබඳ පුහුණු වැඩසටහන - මාලිගාවත්ත (2018 මාර්තු 06)	මුස්ලිම් ඒඩ් ශ්‍රී ලංකා
06	"මුරුක්කු සහ බයිට් මිශ්‍රණ" පිළිබඳ පුහුණු වැඩසටහන - කන්දකාඩු (2018 අප්‍රේල්6 – 8)	පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාලය
07	"තල ආශ්‍රිත නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 මැයි 30)	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය
08	"යෝගට් තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 ජූනි 30)	බංග්ලාදේශයේ කර්මාන්තකරුවන්
09	"ෆයිබර් ග්ලාස් පෙරසවි නිෂ්පාදන" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 අගෝස්තු 16 -17)	ජාතික තරුණ මධ්‍යස්ථානය, මහරගම
10	"කිරි ආශ්‍රිත නිෂ්පාදන තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 සැප්තැම්බර් 19 - 20)	ජාතික තරුණ මධ්‍යස්ථානය, මහරගම
11	"ආහාර ඇසුරුම්කරණ තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන - ලබුදූව (2018 අගෝස්තු 31)	දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය, මාතර
12	පාසල් ගුරුවරුන් සඳහා "අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 ඔක්තෝබර් 29)	ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම
13	"පීසා, සීනි සම්බෝල බනිස් සහ සමෝසා නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 නොවැම්බර් 19)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රත්මලාන
14	"පාන්, මාළු බනිස් සහ පේස්ට්‍රි නිෂ්පාදනය" පිළිබඳ පුහුණු වැඩසටහන -(2018 දෙසැම්බර් 05)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රත්මලාන

ශිෂ්‍යයින් සහ කර්මාන්තකරුවන් 136 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව 2018 වර්ෂයේදී කාර්මික සහතික පත්‍ර පාඨමාලා 06 ක් පවත්වන ලදී.

වගුව 3.8.2 : කාර්මික සහතිකපත්‍ර පාඨමාලා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

අංකය	පාඨමාලාවේ නම	පාඨමාලා කාලය
01	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (11 වැනි කණ්ඩායම)	2017 දෙසැම්බර් 09 – 2018 පෙබරවාරි 09
02	කුළුබඩු සැකසුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (4 වැනි කණ්ඩායම)	2018 ජනවාරි 27 – 2018 අප්‍රේල් 07
03	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (12 වැනි කණ්ඩායම)	2018 පෙබරවාරි 14 – 2018 මැයි 30
04	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (13 වැනි කණ්ඩායම)	2018 ජූනි 07 – 2018 අගෝස්තු 31
05	බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (2 වැනි කණ්ඩායම)	2018 අගෝස්තු 11
06	පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (14 වැනි කණ්ඩායම)	2018 සැප්තැම්බර් 06 – 2018 දෙසැම්බර් 12

වගුව 3.8.3 : යෝග්‍ය දේශීය සහ විදේශීය තාක්ෂණය ලබා දීම

අංකය	වැඩසටහන් විස්තරය
01	ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය සමග සාකච්ඡා කර “දුම්ගැසූ කරවල සහ වියළි කරවල” නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (2018 ජූලි 31)
02	ඇමසන් ට්‍රේඩිං (පුද්) සමාගම සමග සාකච්ඡා කර “තේ නිෂ්පාදනවල අගය එකතු කිරීම” පිළිබඳ පුහුණු වැඩසටහන (2018 ඔක්තෝබර් 26)
03	පොල් පර්යේෂණ ආයතනය සමග සාකච්ඡා කර “පිරිසිදු පොල් තෙල් නිෂ්පාදනය සහ තත්ත්ව සහතිකකරණය” පිළිබඳ පුහුණු වැඩසටහන (2018 ඔක්තෝබර් 30)
04	“සහල් පිටි පාන්, කුරක්කන් පිටි පාන් සහ සහල් පිටි මාළු බනිස්” නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (2018 නොවැම්බර් 02)
05	ජාතික මෝස්තර මධ්‍යස්ථානය සමග සාකච්ඡා කර “කඩදාසි පල්ප ආශ්‍රිත නිෂ්පාදන” පිළිබඳ පුහුණු වැඩසටහන (2018 නොවැම්බර් 23)
06	පේරාදෙණිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමග සාකච්ඡා කර “බිම අතුරන ගඩොල්, විසිතුරු භාණ්ඩ සහ ටයිටේනියම් ඩයොක්සයිඩ් ආශ්‍රිත මල්පෝච්චි නිෂ්පාදනය” පිළිබඳ පුහුණු වැඩසටහන - කොත්මලේ (2018 නොවැම්බර් 19 -20)
07	කාර්මික සංවර්ධන මණ්ඩලයේ රබර් සංවර්ධන අංශය සමග සාකච්ඡා කර “කොහු පෝච්චි” නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (2018 නොවැම්බර් 29)
08	ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකය සමග සාකච්ඡා කර “සහල් ආශ්‍රිත නිෂ්පාදන” නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන (2018 දෙසැම්බර් 18)
09	හික්කඩුවෙහි පිහිටි මධුර එකෝ ක්‍රාෆ්ට් ආයතනය සමග සාකච්ඡා කර “අතින් නිපදවන ලද කඩදාසි නිෂ්පාදන” පිළිබඳ පුහුණු වැඩසටහන (2018 දෙසැම්බර් 16)
10	පානදුර පිහිටි බෝට් බිල්ඩිං ටෙක්නොලොජි ඉම්ප්‍රූව්මන්ට් ඉන්ස්ටිට්‍යූට් ලංකා (පුද්) සමාගම සමග සාකච්ඡා කර “ශ්‍රී ලංකාවේ සවිබල ගැන්වූ ෆයිබර් ග්ලාස් නිෂ්පාදනවල අපනයන විභවතාවය වැඩිදියුණු කිරීම” පිළිබඳ පුහුණු පාඨමාලාව (2018 දෙසැම්බර් 26 -28)

3.8.6 තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීම

තාක්ෂණ සේවා අංශයෙහිදී සහ ඉන් පිටතදී ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ තාක්‍ෂණය ලබා දීමේ වැඩමුළු 93 ක් පවත්වන ලද අතර එම වැඩමුළු හරහා සමස්ත ලෙස පුද්ගලයින් 2,343 දෙනෙකු පුහුණු කර ඔවුන්ට සහාය ලබා දෙන ලදී.

සමස්ත ප්‍රගතිය සලකා බැලීමේදී, 2018 මූල්‍ය වර්ෂය තුළදී තාක්ෂණ සේවා අංශය පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් රු. 9,887,000 ක මුදලක් උපයා ගෙන ඇත.

3.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

විශාල ශ්‍රම බලකායක් අවශ්‍ය කරන පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පැහැදිලිව ම රැකියා උත්පාදනය කිරීමේ සහ විදේශ විනිමය ඉපැයීමේ ඉමහත් විභවතාවයක් සහිත කර්මාන්තයක් වේ. මෙරට පාවහන් සහ සම්භාණ්ඩ කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම 40% - 75% අතර පවතී. වර්තමානයේ අලෙවිකරණ ජාලය ද ඇතුළුව පාවාහන් සහ සම්භාණ්ඩ කර්මාන්තයේ සහ එහි උපකාරක කර්මාන්තවල සෘජු සහ වක්‍ර රැකියාවල යෙදී සිටින සංඛ්‍යාව 300,000 ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. ඉහළ අගය එකතු කිරීමක් සහිත අපනයන තත්ත්වයේ නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන සම්භාණ්ඩ අංශය අත්‍යාවශ්‍ය අංශයක් වේ. නිෂ්පාදන නිපුණතා සංවර්ධනය කිරීම පිණිස වෙළඳ පොළෙහි වඩාත් සුදුසුකම් සහිත සහ පුහුණු සේවකයින් සම්බන්ධ කර ගැනීම සඳහා කර්මාන්තකරුවන්ට සහාය වීම පිණිස සම්භාණ්ඩ සහ පාවහන් යන අංශ දෙකෙහිම තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය පහසුකම් සලසයි. එයට අමතරව, මෙරට පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනයට සම්බන්ධ දේශීය කර්මාන්ත නගාසිටුවීම පිණිස පාවහන් නිර්මාණ සහ මෝස්තර සෑදීම පිළිබඳ නැගී එන කර්මාන්තකරුවන්ට අවශ්‍ය මග පෙන්වීම මෙම මධ්‍යස්ථානය විසින් සපයා දෙනු ලැබේ.

මෙම අංශය විසින් සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම්

- රජයෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබුණු අරමුදල් අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගම්පහ, මහනුවර, කිලිනොච්චි, කුරුණෑගල, මාතලේ, පොළොන්නරුව සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත සඳහා තාක්ෂණය ලබා දීමේ වැඩසටහන් පැවැත්වීමට යොදා ගන්නා ලදී. පෞද්ගලික අංශයේ රැකියා සොයා ගැනීම සඳහා සහ ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා උපකාරී වීම පිණිස දිවයින පුරා සිටින ව්‍යවසායකයින් 594 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 27 ක් පවත්වන ලදී. මෙම ව්‍යාපෘතියෙන් උපයා ගන්නා ලද මුළු ආදායම රු. 4,076,000 ක් විය.
- පාවහන් අංශයේ සේවයේ යෙදී සිටින සේවකයින් සඳහා පාවහන් නිර්මාණය සහ මොස්තර සෑදීම පිළිබඳ පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ නවීන මෝස්තර සෑදීමේ සහ පාවහන් නිර්මාණය කිරීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම සපිරි ඉහළ පුහුණුවක් සහිත මෝස්තර නිර්මාණකරුවන් සපයා දී ඇති අතර එමගින් උපයා ගන්නා ලද ආදායම රු. 356,000 කි.
- බෑග් නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා බෑග් නිර්මාණය කිරීම සහ මෝස්තර සෑදීම පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. කිලිනොච්චි සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යවසායකයින් සහභාගී වූ මෙම වැඩසටහන් මගින් උපයා ගත් මුළු ආදායම රු. 253,000 ක් විය.
- සුළු පරිමාණ පාවහන් නිෂ්පාදකයින්ට පවතින වෙළඳ පොළ සමග මෙන්ම ආනයනික නිෂ්පාදන සමග තරග කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කරන ලදී. මෙම වැඩසටහන සඳහා කොළඹ, මහනුවර, කුරුණෑගල සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් ව්‍යවසායකයින් 119 දෙනෙක් සහභාගී වූහ.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල සම්බන්ධීකරණය මගින් නිෂ්පාදන සහ කළමනාකරණ කුසලතා පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීමේ වැඩසටහන් දෙකක් මහනුවර සහ කුරුණෑගලදී පවත්වන ලදී.
- පාවහන් සහ බෑග් නිෂ්පාදකයින් සඳහා සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියාව පිළිබඳ පහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර, නිෂ්පාදකයින් සහ සැපයුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා අවශ්‍ය වේදිකාවක් නිර්මාණය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම පිණිස අනෙකුත් අමාත්‍යාංශ සමග එක්ව විවිධ කමිටුවලට සහභාගී විය.

- විශ්වවිද්‍යාල සිසුන්ට අවශ්‍ය ප්‍රායෝගික ව්‍යාපෘති සහ කර්මාන්ත අත්දැකීම් සපයා දීම පිණිස දෘශ්‍ය කලා සහ රංග කලාවන්ට අදාළ සම්පත් සහ දැනුම ලබා ගැනීම සඳහා ඔවුන්ට පහසුකම් සලසන ලදී.
- නිෂ්පාදකයින් සඳහා පිරිසැකසුම් පහසුකම් සපයා දෙන ලද අතර කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පුහුණුව ලැබ පාවහන් කර්මාන්ත ආරම්භ කිරීමට උනන්දුවෙන් සිටින ව්‍යවසායකයින්ට ඔවුන්ගේ මූලික ආයෝජනයෙහි අවදානම අඩු කිරීම පිණිස සහනදායී පහසුකම් සපයා දෙන ලදී. සේවා සැපයීම මගින් මෙම මධ්‍යස්ථානය උපයාගත් මුළු ආදායම රු. 143,000 ක් විය.
- පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයාගෙන් ලැබුණු අරමුදල් යොදා ගනිමින් වවුනියාව සහ පොළොන්නරුව පුනරුත්ථාපන මධ්‍යස්ථානවලදී පාවහන්, බෑග් සහ අනෙකුත් සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 12 ක් පවත්වන ලදී.
- යුධ හමුදා සෙබළුන් පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයට සම්බන්ධ කර ගැනීම පිණිස, ඔවුන්ට අදාළ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා ලබා දීම සඳහාත්, ඔවුන්ගේ ජීවනෝපාය සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහාත් වැඩමුළු සහ ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිටින පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින් සහ පුහුණු ආයතන පිළිබඳ දත්ත සංචිතයක් පවත්වාගෙන යනු ලැබේ.
- 2018 වර්ෂය තුළ මෙම මධ්‍යස්ථානය උපයා ගත් මුළු ආදායම රු. මි. 6.5 ක් වේ.
- කාන්තාවන්ගේ සහ මහතුන්ගේ පාවහන් සහ කාන්තා අත් බෑග්, ගමන් මළු සහ උර මත එල්ලන බෑග් ඇතුළු සම්භාණ්ඩ යන කාණ්ඩ යටතේ මෝස්තර නිර්මාණ තරගයක් සංවිධානය කරන ලදී. නැගී එන තරුණ මෝස්තර නිර්මාණ ශිල්පීන්ට තම හැකියාවන් ප්‍රදර්ශනය කිරීම සඳහා අවස්ථාව සපයා දීම මෙහි ප්‍රධාන අරමුණ විය.

3.10 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

කර්මාන්තකරුවන්ට නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ පහසුකම්, ව්‍යාප්ති සහ උපදේශක සේවා, සේවාදායකයින්ගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සකස් කළ ස්වාභාවික සහ කෘත්‍රිම රබර් සංයෝග සකස් කිරීම, සහ රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් පිරිසැකසුම්කාරක ද්‍රව්‍ය අලෙවි කිරීම ආදී සේවා සපයා දීම පිණිස පැලියගොඩ රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය පිහිටුවා තිබේ. අන්තර්ජාතික වශයෙන් අගය කරනු ලබන සහ පිළිගැනීම සහිත භෞතික ගුණාංගයන්ගෙන් යුතු තත්ත්වයට අමු රබර් පිරිසැකසුම් කිරීම මගින් අගය එකතු කළ රබර් නිෂ්පාදන නිෂ්පාදකයෙක් වීම පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලය තමන් පිළිබඳව ම ආඩම්බර වේ.

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය විසින් තාක්ෂණ සේවා සහ තොරතුරු, විශේෂඥ උපදේශක සේවා සහ රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධ උපදෙස් සේවා ආදිය සපයා දෙනු ලබයි. මෙම අංශයට ඝන ටයර්, රබර් අත්වැසුම්, රබර් බෑන්ඩ්, නෙරවුම්, පාපිසි, සහ වෙනත් විවිධ භාණ්ඩ ආදියෙන් සමන්විත පුළුල් පරාසයකට අයත් නිෂ්පාදන කළඹක් තිබේ. මෙම අංශයෙහි සිටින විවිධ දක්ෂතාවයන් සහ පළපුරුද්ද සහිත තාක්ෂණවේදීන් සහ මෝස්තර නිර්මාණ ශිල්පීන් නිසා රබර් භාණ්ඩ නිෂ්පාදකයින්ට වෙළඳ පොළෙහි පවතින දැඩි සහ තරගකාරී අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නිෂ්පාදන සිදු කිරීමට අවස්ථාව උදා වී ඇත.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ රබර් සංවර්ධන මධ්‍යස්ථානයෙහි සේවා විභවතාවය වැඩි දියුණු කිරීම පිණිස ආතතිය, සම්පීඩනය, ආනමනය, ව්‍යාකෘතිය සහ අනෙකුත් පරීක්ෂාවන් සිදු කිරීම සඳහා සුදුසු ටෙන්සොමීටර් යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. අලුතින් සවි කරන ලද “අධි තාක්ෂණ ආතන්‍ය පරීක්ෂණ යන්ත්‍රය” යොදා ගැනීම මගින් රබර් ආදර්ශවල ආතන්‍ය ගුණ පරීක්ෂා කිරීම සඳහා සිදු කරනු ලබන පරීක්ෂණවල සවිස්තරාත්මක තොරතුරු සහිත පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමේ හැකියාව වැඩි දියුණු කර ඇත.

මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල පුවත් සඟරාව (2018 ජූලි - සැප්තැම්බර්)

වගුව **3.10.1 :** 2018 වර්ෂය තුළදී මෙම අංශය විසින් සපයා දෙන ලද සේවාවන්

අංකය	සේවාව	මිනුම් දර්ශකය	සංඛ්‍යාව
(01)	තාක්ෂණය ලබා දීම	සේවාදායකයින් සංඛ්‍යාව	17
	පුහුණු වැඩසටහන්	සේවාදායකයින් සංඛ්‍යාව	32
(02)	පරීක්ෂණ පහසුකම් (අපනයන වෙළඳ පොළ සඳහා රබර් නිෂ්පාදන නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් වෙත ලබා දෙන ලද පරීක්ෂණ පහසුකම් ද මෙයට ඇතුළත් වේ.)	වැඩ සංඛ්‍යාව	134
(03)	උප කොන්ත්‍රාත් අවස්ථා	වැඩ සංඛ්‍යාව	06
(04)	නිෂ්පාදන සංවර්ධන සහ විවිධාංගීකරණ	වැඩ සංඛ්‍යාව	19
(05)	තාක්ෂණ උපදේශක සේවා	සංඛ්‍යාව	123

3.10.1 සංවර්ධන ක්‍රියාකාරකම්

2018 වර්ෂය තුළදී පහත සඳහන් සංයෝග නිර්මාණය කිරීමේ හා සංවර්ධනය කිරීමේ, තත්ත්වය වැඩි දියුණු කිරීමේ සහ නිෂ්පාදන සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.

(01)	**විශේෂ වැඩ සැලසුම් කිරීම සහ සකස් කිරීම** **සමස්ත වටිනාකම: රු. 1,305,000**
	නිෂ්පාදන
i	ඩෝර් ගේට් සීල්
ii	රොන් බොර යන්ත්‍රය සඳහා ට්‍රොලි රෝද
iii	මඩ් සර්වයිවල් පැකිං
iv	ෆුඩ් ග්‍රේඩ් ලෙටර් සෙට්
v	ගැස්කට් රබර් රිංග්
vi	ගෑස් නොබ්
(02)	**තත්ත්වය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම්:** **සමස්ත විටනාකම: රු. 37,400**
	නිෂ්පාදන
i	ටයර් ත්‍රෙඩ්
ii	ඩොක් ෆෙන්ඩර්ස්
iii	රබර් බීඩිං
iv	ඩෝර් ගේට් සීල්
v	එක්සර්සයිස් රබර් බෑන්ඩ්
vi	ලිප් සීල්ස්
vii	ලේටෙක්ස් ග්ලව්ස්

(03)	**ප්‍රධාන සංයෝග සකස් කිරීමේ වැඩ සමස්ත වටිනාකම: රු. 155,000**
	නිෂ්පාදනය
i	ටයර් ත්‍රෙඩ්
ii	රබර් මවුන්ටිං බුෂ්
iii	වෝටර් සීල්
iv	රබර් බූට්
v	රබර් මවුන්ට්
vi	බ්‍රේක් වොෂර්
vii	රබර් බුෂ්
x	ප්‍රොපෙලර් බුෂ්
xi	ටෝයිස් (ෆුඩ් ග්‍රේඩ්)
xii	ෆීඩිං රෝලර් (ෆුඩ් ග්‍රේඩ්)

නව ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම පිණිස සහ දැනට සිටින කර්මාන්තකරුවන් විසින් නිපදවනු ලබන නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය 2018 වර්ෂය තුළදී වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණය නිරූපණය කිරීමේ වැඩසටහන් 08 ක් පැවැත්වූයේය. එමෙන්ම, ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය විසින් පවත්වනු ලබන රබර් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් සඳහා මෙම මධ්‍යස්ථානය ප්‍රායෝගික පංති සංවිධානය කළේය. 2018 වර්ෂය තුළදී තාක්ෂණික සහ වාණිජ මෙහෙයුම් මගින් උපයා ගන්නා ලද සමස්ත ආදායම රු. මි. 22 ක් විය (වැට් සහ ජා.ගො.බ. රහිතව).



4. මූල්‍ය සමාලෝචනය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
2018 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත .)

	සටහන්	2018	2017
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	13	1,517,011,982	1,451,043,622
ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ		93,030,832	33,744,045
ස්ථාවර තැන්පත්	14	66,023,698	59,764,317
		1,676,066,512	1,544,551,984
ජංගම වත්කම්			
බඩු තොග	15	21,441,203	22,150,901
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු	16	26,096,845	19,269,861
වෙනත් ජංගම වත්කම්	17	65,867,141	108,821,480
තැන්පතු සහ පූර්ව ගෙවීම්	18	23,178,068	32,913,210
ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති	19	13,818,107	6,676,099
මුදල් සහ මුදල් හා සමාන දෑ	20	88,928,752	108,805,600
		239,330,115	298,637,150
මුළු වත්කම්		1,915,396,627	1,843,189,134
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන	21	295,899,850	289,185,401
ප්‍රාග්ධන සංචිත		6,243,013	6,243,013
පවරා දෙන ලද වත්කම්වල වටිනාකම	22	13,447,061	13,447,061
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය	23	982,704,132	988,387,631
විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති	24	481,431,241	391,692,201
		1,779,725,297	1,688,955,307
රජයේ ප්‍රදාන		-	1,930,291,117
සමුච්චිත පාඩු	25	(269,047,195)	(2,203,038,173)
		(269,047,195)	(272,747,056)
මුළු හිමිකම්		1,510,678,102	1,416,208,251
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	26	165,915,476	149,510,467
විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රදාන	27	31,862,586	15,508,332
		197,778,062	165,018,798
ජංගම වගකීම්			
රජයට ගෙවිය යුතු හිග	28	75,279	84,059
සංස්ථාවට ගෙවිය යුතු හිග	29	7,494,742	27,469,211
බැංකු ණය ශේෂ	20	37,478,289	38,761,209
ප්‍රතිපාදන සහ උපචිත වියදම්	30	161,892,154	195,647,606
		206,940,463	261,962,085
		1,915,396,627	1,843,189,134

අධ්‍යක්ෂ - මුදල් : අත්සන් කළේ

"පිටු අංක 05 සිට 15 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක 16 සිට 28 දක්වා ඇති සටහන් මෙම ප්‍රකාශන සම්පූර්ණවීම සඳහා අවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය."

අත්සන් කළේ	**අත්සන් කළේ**	**අත්සන් කළේ**
සභාපති	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික(1)**	**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2)**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

	සටහන්	2018	2017
ආදායම	**05**	465,560,559	283,928,764
අලෙවි සහ සේවා පිරිවැය	**06**	(323,131,381)	(186,709,232)
දළ ලාභය		**142,429,178**	**97,219,533**
වෙනත් ආදායම්	**07**	107,469,751	88,364,701
රජයේ පුනරාවර්තන ප්‍රදාන	**08**	295,000,000	278,000,000
පරිපාලන වියදම්	**09**	(549,535,526)	(490,715,818)
අලෙවි බෙදා හැරීම් වියදම්	**10**	13,485,125	13,993,716
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල		**8,848,528**	**(13,137,868)**
මූල්‍ය පිරිවැය	**11**	(4,387,319)	(4,990,928)
බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම / (පාඩුව)		4,461,209	(18,128,796)
වෙනත් විස්තීර්ණ ආදායම්	**12**	(3,060,717)	605,676
වර්ෂය සඳහා ශුද්ධ ආදායම / (පාඩුව)		**1,400,492**	**(17,523,120)**
අති විශේෂ අයිතම	**15**	(996,420)	-
අති විශේෂ අයිතමවලට පසු මුළු විස්තීර්ණ (පාඩුව) / ආදායම		**404,072**	**(17,523,120)**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

	විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රාග්ධන සහ සංචිත	පවරාදෙන ලද වත්කම් වටිනාකම	ප්‍රත්‍යාගණන අතිරික්තය	විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන - ව්‍යාපෘති	රජයේ ප්‍රදාන	සමුච්චිත අතිරික්තය / හිගය	එකතුව
2017 ජනවාරි **01** දිනට ශේෂය	282,787,422	6,243,013	13,447,061	961,817,783	357,657,514	1,930,291,117	(2,154,331,322)	**1,397,912,592**
විශේෂ ව්‍යාපෘතියට මාරු කිරීම්	-	-	-	-	(15,000,000)	-	-	**(15,000,000)**
	282,787,422	6,243,013	13,447,061	961,817,783	342,657,514	1,930,291,117	(2,154,331,322)	**1,382,912,592**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	-	-	-	(31,183,732)	**(31,183,732)**
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	(17,523,120)	**(17,523,120)**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	26,569,849	-	-	-	**26,569,849**
රජයේ ප්‍රදාන	55,000,000	-	-	-	66,953,882	-	-	**121,953,882**
ප්‍රදාන ක්‍රමක්ෂය	(48,602,021)	-	-	-	(17,919,195)	-	-	**(66,521,216)**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**289,185,400**	**6,243,013**	**13,447,061**	**988,387,632**	**391,692,201**	**1,930,291,117**	**(2,203,038,174)**	**1,416,208,255**
2018 ජනවාරි **01** දිනට ශේෂය	**289,185,400**	**6,243,013**	**13,447,061**	**988,387,632**	**391,692,201**	**1,930,291,117**	**(2,203,038,174)**	**1,416,208,255**
ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම් සමුච්චිත අතිරික්තය/හිගය	-	-	-	-	-	(1,930,291,117)	1,930,291,117	**-**
	289,185,400	6,243,013	13,447,061	988,387,632	391,692,201	-	(272,747,057)	**1,416,208,255**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	-	-	-	(2,387,712)	**(2,387,712)**
විකුණන ලද වාහන මත ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-	(5,683,500)	-	-	5,683,500	**-**
වර්ෂය සඳහා ලාභය	-	-	-	-	-	-	404,072	**404,072**
රජයේ ප්‍රදාන	65,143,000	-	-	-	114,522,925	-	-	**179,665,925**
ප්‍රදාන ක්‍රමක්ෂය	(58,428,551)	-	-	-	(24,783,885)	-	-	**(83,212,436)**
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**295,899,850**	**6,243,013**	**13,447,061**	**982,704,132**	**481,431,241**	**-**	**(269,047,196)**	**1,510,678,105**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.)

වර්ෂය සඳහා ශුද්ධ (පාඩුව)/ආදායම		**404,072**
මූල්‍ය නොවන අයිතම සඳහා ගැළපීම්		
ක්ෂයවීම්	47,640,463	
ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම්	(954,632)	
චලනය නොවන තොග සඳහා වෙන් කිරීම්	183,177	
පිත්තල ලෝහ කුට්ටි නැතිවීම සඳහා වෙන් කිරීම්	996,420	
කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම්	2,170,000	
කම්කරු නඩු සඳහා වෙන් කිරීම්	341,018	
දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මත ලාභය	(2,409,234)	
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(83,212,436)	
විශේෂ ව්‍යාපෘති ක්‍රමක්ෂය	(2,287,743)	
බොල් සහ අඩමාන ණය	(13,682,665)	
පොළී ආදායම	(10,553,462)	
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	30,639,133	(31,129,960)
		(30,725,887)
ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		(14,234,124)
		(44,960,011)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
තොග (වැඩිවීම) / අඩුවීම	(469,898)	
ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩුවීම	4,313,885	
අනෙකුත් ශුද්ධ ජංගම වත්කම් (වැඩිවීම) / අඩුවීම	43,044,865	
ශුද්ධ පූර්ව ගෙවීම් (වැඩිවීම) / අඩුවීම	10,749,497	
රජයට ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම)	(8,780)	
ණය හිමියෝ සහ උපචිත ගාස්තු (වැඩිවීම)/අඩුවීම	(33,755,452)	
සංස්ථාවට ගෙවිය යුතු මුදල් වැඩිවීම / (අඩුවීම)	(19,974,469)	3,899,647
මෙහෙයුම් තුළින් ජනිත වූ මුදල්		**(41,060,364)**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනයන්		
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(6,259,381)	
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය කළ මුදල	(59,286,788)	
දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මගින් උපයා ගත් මුදල	5,060,300	
පොළී ආදායම	10,553,462	
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම / ඉදිකිරීම	(119,531,877)	(169,464,284)
		(210,524,648)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනයන්		
ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති	114,522,925	
ලැබුණු ප්‍රදාන - විශේෂ ව්‍යාපෘති	75,397,215	
ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන	65,143,000	
විශේෂ ව්‍යාපෘතිවල ආයෝජනය	(63,132,419)	191,930,720
		(18,593,927)
එකතු කළා: 2018.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		**70,044,390**
2018.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ		**51,450,463**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ ලංකා කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට සහාය වීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යය වේ.

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවය පදනමකින් සකස් කර ඇති අතර, මෙම කාල පරිච්ඡේදය පුරාවට අනුකූල වන ලෙස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇත.

2.2 දේපළ, පිරියත සහ උපකරණ

සියලු ම දේපළ, පිරියත සහ උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කර ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුව ම දරණ ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාල පරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම වන එම අයිතම ගලවා ඉවත්කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරිවැයට ඇතුළත්වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වැඩිවීමක් සිදු වුවහොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනා ගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩුවීමකට ප්‍රතිවර්ත නොවන්නේ නම්, එය සෘජුව ම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථාවලදී, වැඩිවීම පූර්වයෙන් ලියා ගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනා ගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තන නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනා ගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අය කරනු ලැබේ. වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරි වී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමෙහිදී හෝ බැහැර කිරීමෙහිදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුළත් කිරීම හෝ වෙනම ම වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදු කරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අළුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරණ ලද මූල්‍ය කාල පරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.2 දේපළ, පිරියත සහ උපකරණ (ඉතිරි කොටස)

(ආ) ක්ෂයවීම්

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම අරම්භ වූ දිනයේ සිටම ක්ෂවීම් අඩු කිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු, එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩු කරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තුමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

1	ඉඩම් වැඩි දියුණු කිරීම හා ගොඩනැගිලි	2.5%
2.	පරිගණක මෘදුකාංග	7%
3.	පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලයීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලීබඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍යා සේවා, PABX සේවා සහ වෙනත් වත්කම්	10%
4.	පරිගණක සහ මෝටර් වාහන	20%
5.	මෙවලම්, පොත්, සහ ගමන් මලු	25%

වත්කම්වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සෑම ශේෂ පත්‍ර දිනයකදීම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම් එකෙනෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය / පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. මේවා ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2:3:1: පහත සඳහන් ඉඩම් කා.සං.ම. විසින් පරිහරණය කරනු ලබන නමුත් මණ්ඩලයට එම ඉඩම්වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති නිසා මණ්ඩලය ඒවා ප්‍රාග්ධනිත කර නැත:

අංකය	ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය	වර්ගඵලය			භාවිතා කරන කාර්යය	බුක්තිය ලබා ගත් දිනය	අත්පත් කර නොගැනීමට හේතුව	අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය
		අක්කර	රූඩ	පර්චස්				
1	අනුරාධපුර		1	20	ප්‍රාදේශීය කාර්යාලය	1971 සිට	රජයේ ඉඩමකි	බදු ගිවිසුමක් මගින් අයිතිය පවරා දී ඇත.
					පොදු සේවා මධ්‍යස්ථානය		රජයේ ඉඩමකි	බුක්තිය ලබා දී ඇත, එහෙත් අයිතිය පවරා දී නැත.
2	පොළොන්නරුව		3	26.6	ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව	1992 සිට	රජයේ ඉඩමකි	දිස්ත්‍රික් ලේකම් වෙත භාර දී ඇත.
3	මාතර	1	1	6.2	ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය			අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත.
4	හම්බන්තොට				ප්‍රාදේශීය කාර්යාලය	2006 සිට	ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත	
					සම්භාණ්ඩ මධ්‍යස්ථානය - විතාරන්දෙනිය			ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.
5	මොණරාගල			48	ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත.
6	බදුල්ල			50	"ගම් උදා" මධ්‍යස්ථානය - මහියංගනය	1997 සිට		සමෘද්ධි බැංකුව - මහියංගනය විසින් ලබා දී ඇති ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත.
7	කොළඹ	1.2953 Hec			ප්‍රධාන කාර්යාලය		අයිතිය: කුඩා කර්මාන්ත දෙපා.	ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාළ ආයතනවලට ලිපියක් මගින් ඉල්ලීම් කර ඇත.
					නවබිම මධ්‍යස්ථානය			
8	කොළඹ	0.4046 Hec			රබර් සංවර්ධන මධ්‍යස්ථානය	1980 සිට	99 අවුරුදු බදු පදනම මත	
9	අම්පාර				ප්‍රාදේශීය කාර්යාලය		රජයේ ඉඩමකි	ලිපියක් මගින් පවරා දී ඇත.
10	කොළඹ	13	2	6	කාර්මික ජනපදය - පානළුව	2006 සිට		කැබිනට් පත්‍රිකාව අනුමත කර ඇත. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.
11	බද්දේගම	1	2	0.5	කාර්මික ජනපදය	1992 සිට		ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට ඉඩම් පවරා දීම සඳහා කා.සං.ම. සහ ඉ.ප්‍ර.කො. අතර සාකච්ඡා පවත්වා ඇත.
12	බෙලිඅත්ත	10	0	29.2	කාර්මික ජනපදය	1995 සිට		

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2:4 මූල්‍ය වත්කම්

2:4:1 වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කරගත් කාර්යය පදනම් කර ගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ අයවිය යුතු මුදල් සක්‍රීය වෙළඳ පොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂ පත්‍ර දිනෙන් පසු මාස 12 කට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම්වල ඇතුළත් කර ඇත.

2.4.2 මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගනු දෙනු පිරිවැය එකතු කළ අගයට හඳුනා ගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

2.4.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනා ගත් වටිනකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම උපලබ්ධි කර වගකීම පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

2.4.4 මූල්‍ය වත්කම් හානිකරණය

(අ) ක්‍රමක්ෂය කළ පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)

සෑම වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වත්කම් වලට හානි සිදු වී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇති කරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානි වී ඇති බවට සලකනු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරනු ලැබේ.

හානිකරණයට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේ ද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින් ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩුවන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනා ගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.10 වැනි සටහනෙහි විස්තර කර ඇත.

2.5 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර ඉන් පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නො සැළකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.6 තොග

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරනු ලැබේ. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇස්තමේන්තු කළ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය කරන පිරිවැය අඩු කළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරණ ලද පිරිවැය පහත සඳහන් පරිදි ගණන් ගනු ලැබේ.

අමුද්‍රව්‍ය	- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
නිමි භාණ්ඩ	- පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට
ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ	- සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගත් නිෂ්පාදන පොදු කාර්ය වලින් යෝග්‍ය කොටසක පිරිවැයට.

2.7 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේදී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටු කරන ලද සේවා සඳහා ගනුදෙනුකරුවන් ගෙන් අය විමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ වලට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අය කර ගැනීමට නොහැකි වනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත් භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩ කිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගලනයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. 2018 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ:

ප්‍රවර්තන වර්ෂය	0%
වසර 01 – 02	10%
වසර 03 – 05	25%
වසර 05 ට වැඩි	100%

2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දේ ට අත ඉතුරු මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, මාස තුනක හෝ එයට අඩු මුල් කල් පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. බැංකු අයිරා ශේෂ පත්‍රයේ ජංගම වගකීම්වල ණය ගැනුම් යටතේ පෙන්වා ඇත.

2.9 ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍ය විය හැකි විට සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

2.10 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

ශේෂ පත්‍රයෙහි වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයෙහි සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයකදී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.11 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේ දී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දිය වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරණ පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ.

නිර්වචිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිත කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කරවල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල් පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසිවලට ආසන්න වන කොන්දේසි සහිත අනාගත මුදල් ගලායාම් වට්ටම් කරමින් නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයුගණක උපකල්පනයන්හි වෙනස්කම් මගින් හටගන්නා ආයුගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නෙහි නම් අතීත සේවා පිරිවැය එකෙනෙහි ම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. මෙසේ කිරීමෙහිදී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.12 නිර්වචිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවක භාරකාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලබයි.

2.13 ආයෝජන

ආයෝජන තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙන යනු ලැබේ.

2.14 රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර මෙහිදී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසිවලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මගින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමග ගැළපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ වලට අදාළ රජයේ ප්‍රදාන විලම්බිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර ඇති අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

2.15 පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබා දෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, ප්‍රදායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව අසාධාරණ හුවමාරු ගණුදෙනුවක් ප්‍රතිඵලය වන තරමට ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැළකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනා ගත යුතුය.

2.16 ආදායම් හඳුනාගැනීම

(අ) විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා

අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා දී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයා ගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනා ගනු නො ලැබේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2.16 ආදායම් හඳුනාගැනීම (ඉතිරි කොටස)

(ආ) පොළී ආදායම

පොළී ආදායම කාල සමානුපාත පදනමකින් හඳුනා ගනු ලැබේ.

ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීමේදී විකුණනු ලබන භාණ්ඩ සඳහා හෝ ඉටු කරනු ලබන සේවා සඳහා ලැබෙන හෝ ලැබිය යුතු ප්‍රතිස්ථාවෙහි සාධාරණ වටිනාකමෙන් සමන්විත වේ. ආදායම එකතු කළ අගය මත බද්ද, ප්‍රතිලාභය, ප්‍රතිදානය සහ වට්ටම්වල ශුද්ධ අගය මගින් පෙන්වනු ලැබේ.

2.17 වියදම් හඳුනා ගැනීම

(අ) මෙහෙයුම් වියදම්

වියදම් උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහිදී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහිදී දරණ ලද සියලුම වියදම් ආදායමට අය කරනු ලැබේ.

(ආ) ශුද්ධ මූල්‍ය පිරිවැය

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය, සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරණ ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

3. මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

